中国国际广播电台
CHINA RADIO INTERNATIONAL

# සුභාසර්

## 蓮花

沈鹏

**2017 – තෙවන කලාපය**



中国国际广播电台和斯里兰卡红十字协会联合出版




# චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය

චීනය  සහ ජාත්‍යන්තර ප්‍රජාව එකට එක් කරමින් චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය ආරම්භ කෙරුණේ 1941 දෙසැම්බර් මස 3 වැනි දාය. අද වන විට එය ලොව පුරා වැඩිම භාෂා ගණනාවක් විකාශනය කරන විශාලතම ගුවන් විදුලි ජාලයක් බවට පත්ව තිබේ. එයින් ලොව පුරා විකාශනය කෙරෙන භාෂා ගණන මේ වන විට 65කි. ලෝකයේ සංනිවේදන විධික්‍රම වඩාත් පුළුල් වීමත් සමඟ අන්තර්ජාල රූප මාධ්‍ය හා ජංගම දුරකථන සහ පොඩ්කාස්ටින් වැනි නූතන බහුවිධ මාධ්‍ය ඔස්සේ සිය විකාශන ජාලය ශක්තිමත් කිරීමට චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය පියවර ගත්තේය.

ඒ අනුව වසර 2011 ජනවාරි 18 වනදා CIBN චීන අන්තර්ජාතික ගුවන්විදුලි විකාශන ජාලය ආරම්භ කෙරිණ. ලොවපුරා ප්‍රවෘත්ති ඒජන්සි මධ්‍යස්ථාන 8ක් පවතින අතර රටවල් 32ක ප්‍රවෘත්ති වාර්තාකරණ ඒජන්සි ආයතන පිහිටුවා තිබේ. ලොව පුරා විසිරුණු කොන්ෆියුසියස් මධ්‍යස්ථාන සංඛ්‍යාව 13කි. චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ අසන්නන්ගේ සමාජ 4114ක් ලොව පුරා ක්‍රියාත්මකය.

# සුභාසර් 蓮花


**චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය**

**SINHALA SERVICE**

**CHINA RADIO INTERNATIONAL**

No.16A, Shijingshan Road,
Beijing, P.R. China
Post code:100040

00 86 10 6889 2373/0439

00 86 10 68892361

sinhalacri@gmail.com

http://sinhalese.cri.cn/

Cheena Sinhala handa

Voice of China-Lanka



**අනුශාසකත්වය**

ජගත් අබේසිංහ

සුදත් මඩුගල්ල

**සංස්කාරක**

ශී යුයැ, සුන් ජ්යා ජ්යා, වං යිං

**කතෘ මඩුල්ල**

ශී යුයැ, ෂෙං ලී, ලියු හුයි,
හාඕ ලී ෆාං, වං යිං, හැන් ජ්යැන්,
සුන් ජ්යා ජ්යා, චෙන් ගුවැන් වන්,
රවිමල් හඳුවල, සුගත් රත්නායක,
නිසංසලා රත්නායක

**ප්‍රකාශනය**

චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය සහ
ශ්‍රී ලංකා රතු කුරුස සමාජය


## පටුන


90 වැනි විය සපුරන
චීන මහජන විමුක්ති හමුදාව 2

චීනයේ අධිවේගී දුම්රිය මාර්ග ජාලය 8

ලෝකයේ විශාලතම කෘතීම වනාන්තරය 10

ඒ මෙයි ශැන් බෞද්ධ ආයතනය 12

හරිත සංවර්ධනයට චීනයේ දායකත්වය 14

චීනයේ ගුවෝ ලෝ ටිබෙට් ස්වායත්ත
ප්‍රදේශයේ ගෙසර් සංස්කෘතිය 16

කාබනික වගා නිෂ්පාදනයෙන් සාර්ථක වූ
චීනයේ 'යැන් බ්‍යැන්' ප්‍රදේශයේ වී ගොවිතැන 18

Wechat ජංගම දුරකථන මෘදුකාංගය හා
නව තාක්ෂණ ක්‍රමවේද චීන පොලීසියේ
සේවාවන් තවදුරටත් පහසු කරයි 20

සරළ මෙන්ම පිරිසිඳු ගායකයා චෞ ලෙ 22

චිදිනෙදා චීන බස 26

චීන කෙටි කථාව 28

අසන්නන්ගේ බිත්ති පුවරුව 30

අත්දැකීමෙන් බිඳක් ... 32

ස්ට්‍රෝබරි පුඩින් 35

ශ්‍රී ලංකා රතු කුරුස සමාජයෙන් 36

# 90 වැනි විය සපුරන චීන මහජන විමුක්ති හමුදාව

චීන ජනතාව සතු නව හමුදාවක් වශයෙන් චීන මහජන විමුක්ති හමුදාව බිහි වුණේ මීට වසර 90 කට පෙරදී ය. ගෙවී ගිය වසර 90 තුළ, චීනයේ පමණක් නොව ලෝක සාමය හා ස්ථාවරත්වය ආරක්ෂා කිරීම වෙනුවෙන් චීන මහජන විමුක්ති හමුදාව දැවැන්ත දායකත්වයක් ඉටු කර තිබේ.

නූතන යුගයට ප්‍රවේශ වී විශේෂයෙන් ම විද්‍යා තාක්ෂණය සීඝ්‍රයෙන් දියුණු වෙමින් පවතින රටක හමුදාව වෙත නව වගකීම් මෙන්ම නවාකාර අභියෝගයන්ට ද මුහුණ දීමට සිදු වෙයි. ලෝකයේ විවිධ රටවල් තම හමුදාවන්හි ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරමින් සිටී. හදිසි ප්‍රතිචාර දැක්විය හැකි කුඩා පරිමාණ බහු කාර්ය හමුදාවක් බිහි කිරීම ඇමරිකාවේ වෑයම යි. හමුදා ප්‍රතිසංස්කරණයන් තුළින් නව දර්ශනයක් ඉදිරියට ගෙන යාම රුසියාවේ අභිලාෂයකි. පාබල, ගුවන් සහ නාවික හමුදා වර්ගීකරණය අහෝසි කළ ප්‍රථම රට බවට ජර්මනිය පත් වී තිබේ. මෙවැනි ජාත්‍යන්තර පසුබිමක් යටතේ චීන හමුදාවේ ක්‍රියාකලාපය කුමක් ද යන්න පිළිබඳව අවධානය යොමු කිරීම අතිශයින් වැදගත් ය.

---

පාබල හමුදාව ලෝකයේ ඉපැරණි ඉතිහාසයක් හිමි හමුදා අංශයකි. අවුරුදු අනූවකට පෙර චීන මහජන විමුක්ති සමූහාණ්ඩුවේ පාබල හමුදාව යුද ගිනි මධ්‍යයේ බිහි විය. එතැන් සිට මේ දක්වා, චීන පාබල හමුදාව විවිධ අංශ හා විෂයන්ගෙන් සමන්විත සංයුක්ත හමුදාවක් බවට පත් ව තිබේ. 2015 වසරේ චීන පාබල හමුදාව පිළිබඳ නව අණදෙන ආයතනය ස්ථාපිත කෙරිණ. පෙර පැවති සමූහ කණ්ඩායම් 18 වෙනුවට පාබල හමුදා සමූහ කණ්ඩායම් 13 ක් ස්ථාපිත කිරීමට පියවර ගැනිණ.

ප්‍රතිසංස්කරණයන් තුළින් ශක්තිමත් හා ප්‍රබල පාබල හමුදාවක් යළිත් ගොඩනැගීම එහි අරමුණයි. ප්‍රමාණාත්මකභාවයේ සිට ගුණාත්මකභාවය දක්වා පරිවර්තනය කරමින් කලාපීය ආරක්ෂක වගකීම් වලට පමණක් සීමා නොවී බහුවිධ සටන් නිපුණතාව දියුණු කර ගැනීමට චීන හමුදාව ක්‍රියා කරමින් සිටී. පාබල ගුවන් භටයන්, විශේෂ සන්නද්ධ භටයන් ඇතුළු විවිධ බල ඇණි හිමි චීන පාබල හමුදාව ප්‍රතිසංස්කරණයන් වෙත තවදුරටත් අවධානය යොමු කරමින් සිටී.













චීනය යනු සමුද්‍රතීර කිලෝමීටර් 18 දහසක් මෙන්ම වර්ග කිලෝමීටර් 300 කට වැඩි මුහුදු ප්‍රදේශයක් සතු විශාල සාගරික රටකි. චීන මහජන සමූහාණ්ඩුවේ නාවික හමුදාව ස්ථාපිත කර වසර 68 ක් මේ වන විට ගත වී තිබේ.

ප්‍රතිසංස්කරණයෙන් හමුදා ජවය ඉදිරියට ගෙන යන යුගයේදී චීන නාවික හමුදාවට අයත් සබ්මැරීන හා යාත්‍රා කාර්යබහුල අභ්‍යාස පුහුණු කාලයකට ප්‍රවේශ වී සිටී. ගෙවී ගිය වසර 12 තුළ අඛණ්ඩව විවිධාකාර අසීරු තත්ත්වයන් මධ්‍යයේ ප්‍රතිවිරෝධී සබ්මැරීන, ප්‍රතිවිරෝධී ජල බෝම්බ සහ ගුවන් ප්‍රහාර ඇතුළු සටන් පුහුණු ක්‍රියාකරකම් වලට චීන නාවික හමුදා භටයෝ සහභාගී වූහ. සාමාන්‍යයෙන් ඔවුන් වසරකට දින සීයයක් වැනි කාලයක් මුහුදේ රැඳී සිටී.









විපත් සහන හා මානුෂීය ආධාර සඳහා ආසියාව, අප්‍රිකාව සහ ලතින් ඇමරිකාව යන කලාප වල 20 කට වැඩි රටවල් සඳහා චීන නාවික හමුදාව සිය දායකත්වය ලබා දී තිබේ. චීනය ලෝක සාමය ආරක්ෂා කර ගැනීම සඳහා ප්‍රධාන වගකීම් සහගත රටක් බව ඉන් මනාව හා ආදර්ශවත් ලෙස තහවුරු කර ඇත.





චීන මහජන විමුක්ති හමුදාවේ ගුවන් හමුදාව ස්ථාපිත කෙරුණේ වසර 1949 නොවැම්බර් මස 12 වැනිදායි. 21 වැනි සියවස ගුවන් සියවස ලෙසට හැඳින්විය හැකි ය. ඒ අනුව ජාත්‍යන්තර ක්‍රමෝපායීය තරඟකාරීත්වය සඳහා ගුවන් ක්ෂේත්‍රයේ රැඳී සිටින ගුවන් හමුදාවට සුවිශේෂී වගකීමක් හිමි වෙයි.

චීන ගුවන් හමුදාව තම රටේ ගුවන් සීමාව මෙන්ම අසල්වැසි මුහුදු ප්‍රදේශයන්ට අයත් ගුවන් සීමා ආරක්ෂා කිරීමේ සිට ආසන්න ගුවන් ප්‍රදේශ ආරක්ෂා කිරීම දක්වා ඈත මුහුදු ප්‍රදේශ මුර කළ හැකි ආකාරය වර්ධනය කිරීමට ද අපේක්ෂා කෙරේ. එමෙන්ම, ජාත්‍යන්තරකරණ හමුදාවක් වශයෙන් චීන ගුවන් හමුදාව ඈත මුහුදු ගමන් මුර කිරීම, ඒකාබද්ධ යුධ අභ්‍යාස, ජාත්‍යන්තර සහනාධාර සහ වෛද්‍ය සේවා ඇතුළු දූත ක්‍රියාකරකම් රැසකට සහභාගී වී ජාත්‍යන්තර වගකීම් ඉටු කිරීමට දායක වෙමින් සිටී.

ඉහත සඳහන් කළ ජාතික හා ජාත්‍යන්තර තත්ත්වයන් තුළ චීන මහජන විමුක්ති හමුදාව සීඝ්‍ර නවීකරණයකට ලක් වෙමින් පවතී. මේ වන විට, චීනය ගුවන් යානා ප්‍රවාහන නෞකා ස්වයං ලෙස නිෂ්පාදනය කිරීමේ තාක්ෂණය අත්කර ගැනීමට සමත් ව තිබේ. එමෙන්ම, වෙනත් හමුදා උපකරණ දියුණු කිරීම චීනයේ අභිප්‍රාය යි. චීන සාම සාධක හටයන් ලොව පුරා සාම සාධක මෙහෙයුම් වලදී ඉටු කරන කාර්යභාරය ද ජගත් ප්‍රජාවේ පැසසුමට ලක් ව ඇත. මේ නිසා ලෝකයේ ශක්තිමත් විනයානුකූල හා ආදර්ශවත් හමුදාවක් ලෙසට තවදුරටත් චීන මහජන විමුක්ති හමුදාව ගොඩනැගීමේ කාර්යයේ චීන රජය නියැළී සිටී.














ඉදිරිපත් කිරීම : ශී යුයැ

# චීනයේ අධිවේගී දුම්රිය මාර්ග ජාලය

මෑත වසර 5 තුළ චීනය අධිවේගී දුම්රිය මාර්ග සංවර්ධනය අතින් විශාල ප්‍රගතියක් ලබා ගෙන තිබේ. අධිවේගී දුම්රිය මාර්ගයන්හි සමස්ත දුර කිලෝමීටර් දස දහසක සිට මේ වන විට කිලෝමීටර් 22000 දක්වා වැඩි වී ඇත. මෙලෙස සංවර්ධිත දුම්රිය මාර්ග ජාලය චීන ජනතාවගේ ජීවිතය පහසු කරවයි.

අධිවේගී දුම්රිය මාර්ග ආරම්භ වීමත් සමඟ චීනයේ පිටිසර ප්‍රදේශවල වැසියන්ට ඉතා පහසුවෙන් බෙයිජිං, ශංහයි සහ ගුවෙන් චෙං යනාදි විශාල නගරවලට යන්නට පහසුයි.

නිරිතදිග චීනයේ ගම්මානයක ජීවත් වන වැසියෙක් මෙලෙස පැවසුවේය.

'මගේ උපන් ගමේ වැසියන් පාරම්පරිකව ජීවත්වන්නේ කඳුකර ප්‍රදේශයේයි. විශාල නගරවල පදිංචියට ඔවුන් ගියේ නැහැ. මේ වන විට අධිවේගී දුම්රිය ස්ථානයක් තියෙනවා අපේ උපන් ගමට ආසන්නයේ. ගම් වැසියන්ට එම අධිවේගී දුම්රියෙන් බෙයිජිං අගනුවරට යාමට හැකියි. එමෙන්ම අසල්වැසි නගර අතර අධිවේගී දුම්රිය මාර්ග ආරම්භ කිරීම නිසා එම නගරවලත් පහසුවෙන් සංචාරය කළ හැකියි.' චිඅං මහතා බෙයිජිං නගරය අසල පිහිටි ලං ෆං නගරයේ ජීවත් වෙයි. නමුත් සෑමදාම ඔහු බෙයිජිං නගරයට ගොස් රාජකාරී කටයුතුවල නියැලේ. ලං ෆං සහ බෙයිජිං යන නගර දෙක අධිවේගී දුම්රිය මාර්ග වලින් සම්බන්ධව ඇත. චිඅං මහතාට අධිවේගී දුම්රියෙන් ලං ෆං නගරයේ සිට බෙයිජිං නගරයට ළඟාවීමට ගත වන්නේ, විනාඩි 21 ක පමණ කාලයකි.








චීනය අධිවේගී දුම්රිය ජාලය අඛණ්ඩව සංවර්ධනය කරමින් පවතී.

2016 වසරේ චීනය 'මැදි හා දිගුකාලීන දුම්රිය ජාල සංවර්ධන සැලැස්ම' නිකුත් කළේ ය. එම සැලැස්මට අනුව, 2020 වසර දක්වා චීනයේ අධිවේගී දුම්රිය මාර්ගවල සමස්ත දුර ප්‍රමාණය කිලෝමීටර් 30000ක් දක්වා ළඟාකර ගැනීමට අපේක්ෂා කෙරේ. එමෙන්ම එම මාර්ග ජාලය චීනයේ 80%ක විශාල නගර ආවරණය වනු ඇත. චීනයේ අධිවේගී දුම්රිය ජාල සංවර්ධනය කිරීමේ අරමුණ වන්නේ නගර අතර පරතරය අඩු කිරීම ය.

ගතවූ වසර 5 තුළ චීනයේ සිට යුරෝපා-ආසියා අධිවේගී දුම්රිය මාර්ගය, මධ්‍යම ආසියා දුම්රිය මාර්ගය හා අග්නිදිග ආසියා යන දුම්රිය මාර්ග-යන් ආරම්භ විය. ඒ අනුව, චීනයේ අධිවේගී දුම්රිය මාර්ග පද්ධතිය ඉතා වේගයෙන් සංවර්ධනය වී තිබේ. එමෙන්ම චීනය, මේ වන විට අධිවේගී දුම්රිය මාර්ග ඉදිකිරීමේ තාක්ෂණය අතින් ඉහළ ජාත්‍යන්තර මට්ටමට ළඟාවී සිටී. චීනයේ අධිවේගී දුම්රිය මාර්ග ජාලය මේ වන විට 'චීන නිෂ්පාදනයේ ' සිට 'චීනයේ නිර්මාණය' යන්න පරිවර්තනය සිදු කරන වැදගත් සංකේතයක් බවට පත්වී තිබේ.

ඉදිරිපත් කිරීම : හාඕ ලී ෆාං










# ලෝකයේ විශාලතම කෘත්‍රිම වනාන්තරය

චීනයේ බෙයිජිං අගනුවරට උතුරු දෙසින් විශාල වනාන්තරයක් පිහිටා ඇත. එය ස්වභාවික එකක් නොව මිනිසුන් විසින් වගා කරන ලද කෘත්‍රිම වනාන්තරයකි. එහි බිම් ප්‍රමාණය වර්ග කිලෝමීටර් 700 ඉක්මවයි. ඒ අනුව එය ලෝකයේ විශාලතම කෘත්‍රිම වනාන්තරය බවට පත් වී ඇත.

කෙසේ වෙතත් අඩ සියවසකට පෙර සැයිහැන්බා නමින් හැඳින්වෙන මෙම ප්‍රදේශය කාන්තාරයෙන් ආවරණය වූ නිසරු ප්‍රදේශයක් විය. එම කාලයේ තත්ත්වය සිහිපත් කරමින් වනය රැක බලා ගන්නා පුද්ගලයෙක් මෙසේ පැවසීය.

"අතීතයේ වැලි සහිත සුළං වැඩි වශයෙන් තිබුණා. සමහර විට දහවල් කාලයේ පවා හරිම කළුවරයි. ඒ නිසා දහවල් කාලයේත් තෙල් පහන් භාවිත කරන්නට අවශ්‍යයි. නැත්නම් මොකුත් පෙන්නේ නැහැ."

1962 වර්ෂයේ චීන රජය මෙහි වන වගා වැඩසටහනක් ආරම්භ කිරීමට පියවර ගත්තේ ය. ඒ අනුව 370 දෙනකුගෙන් සමන්විත තරුණයන් පිරිසක් මෙම ප්‍රදේශයට පැමිණියහ. ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුගේ වයස අවුරුදු 20ක් පමණ විය.

එම කාලය ඉතාමත් අපහසු කාලයකි. මන්ද ජල සැපයුම හා විදුලි සැපයුම වැනි යටිතල පහසුකම් නැති තරම් වු නිසායි. කෙසේ වෙතත් ඊට වඩා අපහසු ගැටළුවකට ද තරුණයෝ මුහුණ දී සිටියහ. මොක ද ඔවුන් වගා කළ පැළ වර්ග අතරින් බහුතරය කෙටි කලකින් මිය ගියේ ය. එහෙත් කුමන අපහසුතාවක් තිබුණ ද මෙම ප්‍රදේශය අනිවාර්යයෙන් ම වනයෙන් ආවරණය කිරීමට ඔවුන් තීරණයක් ගත්හ.

එහිදී තවත් ගැටළුවක් ඉස්මතු වී ඇත. ඒ, තරුණයන් වගා කළ වනයට කෘමියන්ගෙන් හානි එල්ල වීමයි. ඉන් ශාක බොහොමයක් මිය ගියේ ය. ඒ හේතුවෙන් කෘමියන් වළක්වාලීම වනය රැක බලා ගන්නන්ගේ වැදගත්ම මෙහෙවරක් බවට පත් විය.

එම ප්‍රදේශයේ රාජ්‍ය නිලධාරියෙක් සඳහන් කළ ආකාරයට, අතීතයේ වගා කර ඇති ගස් වර්ග ඉතාමත් අඩු විය. ඒ නිසා වනයේ කෘමියන් වැඩි වැඩියෙන් සීඝ්‍රයෙන් බෝ විය. පසුව ඔවුහු විවිධ ගස් වර්ග වගා කළහ. ගස් වර්ග වැඩිවීමත් සමඟ යහපත් ජෛව පද්ධතියක් ද බිහි විය. කෘමියන් ද ක්‍රමයෙන් අඩු විය.

මීට අමතරව රසායනික කෘමිනාශක ඉවත් කර ස්වභාවික කෘමිනාශක හඳුන්වාදීමට ද මිනිසුන් පියවර ගත්තේ ය. එවැනි වැඩපිළිවෙල මාලාවක් හේතුවෙන් වනයේ පරිසරය කැපී පෙනෙන ලෙස යහපත් විය. සැයිහැන්බා නමින් හැඳීන්වෙන මෙම වනය හේතු කර ගෙන බෙයිජිං නගරයේ පරිසරය ද යහපත් විය. මොක ද අතීතයේ හුළං හමා එන අවස්ථාවේදී හුළං සමඟ වැලි ද විශාල වශයෙන් පැමිණීය. එහෙත් මේ වන විට බෙයිජිං නගරයට හමා එනු වැලි ප්‍රමාණය අඩ සියවසකට පෙරට වඩා සියයට 70 කින් අඩු වී ඇත.

දැන් මෙම ප්‍රදේශය ඝන වනාන්තරයකින් ආවරණය වූ සුන්දර ප්‍රදේශයක් බවට පත් වී ඇත. වන සතුන් බොහොමයක් ද මෙහි ජීවත් වෙයි.

කෙසේ වෙතත් ප්‍රදේශවාසීන් දැන් අලුත් ගැටළුවකට මුහුණ දෙමින් සිටිති. මොක ද දැව කර්මාන්තය වර්ධනය කරන අතරතුර වනය ආරක්ෂා කිරීමට ද රජය තීරණයක් ගත්තේ ය. ඒ අනුව වසර 2012 සිට මෙම ප්‍රදේශයේ දැව කර්මාන්තය තරමක් අඩු වී ඇත. ලී අලෙවි කිරීමෙන් ලැබූ ආදායම් ද දළ වශයෙන් අඩු විය. දැව කැපීම වෙනුවට දැන් මෙහි ප්‍රදේශවාසීන් සංචාරක කර්මාන්තය ආරම්භ කර ඇත. මීට අමතරව පැළ අලෙවි කිරීම, සුළං බලයෙන් විදුලිය උත්පාදනය කිරීම ද ආරම්භ කර ඇත.

දැන් මෙහි ප්‍රදේශවාසීන්ට නිවාස, වාහන වැනි පහසුකම් ඇත. ජල සැපයුම, විදුලි සැපයුම, මහා මාර්ග, අන්තර්ජාලය වැනි යටිතල පහසුකම් මුළු ප්‍රදේශයේ ම ගොඩ නගා ඇත. ප්‍රදේශවාසීන්ගේ ආදායම් ද වැඩි විය. දැන් මෙහි ප්‍රදේශවාසීන්ට වාර්ෂිකව චීන යුඅැන් කෝටි 60 කට වැඩි ආදායමක් ලැබෙයි. ඇත්තට ම මෙම වනය හේතුවෙන් ප්‍රදේශවාසීන්ට දැන් සුවපත් ජීවිතයක් ගත කිරීමට හැකි වී තිබේ.













ඉදිරිපත් කිරීම : හැන් ජ්‍යැන්

# ඒ මෙයි ශැන් බෞද්ධ ආයතනය

ප්‍රසුගිය සියවසේ මුලදී චීන බුද්ධාගම දුර්වල තත්ත්වයක පැවති නිසා ටැයි සියු ස්වාමීන් වහන්සේ 'ජීවිත බුද්ධාගම සහ පුද්ගලාන්තර බුද්ධාගම' යන සංකල්ප ඉදිරිපත් කළහ. එම සංකල්ප හැඳින්වෙන්නේ බුද්ධාගම ජීවිතයට හා සමාජයට සේවය කළ යුතු බවයි. පසුව චීනයේ ප්‍රකට ස්වාමීන් වහන්සේලා පොදුවේ දැරූ උත්සාහ යටතේ එම සංකල්ප චීනය පුරා ම පැතිර ගොස් ඇත. වසර 1983නේ චීන බෞද්ධ සංගමය පිහිටුවීමේ 30 වැනි සංවත්සර සැමරුම් උත්සවයේදී පුද්ගලාන්තර බුද්ධාගම නූතන චීනයේ බෞද්ධ ක්ෂේත්‍රයේ උපදෙස් සංකල්පය වශයෙන් නියම කරනු ලැබිණ.

බුද්ධාගම මූලික කර ගනිමින් සමාජයට සේවය කිරීමටත් පුළුල් ලෙස ප්‍රචාරය කිරීමටත් ප්‍රවීණයන් පුහුණු කිරීම ඉතා වැදගත් වෙයි. දැනට චීනයේ නිල බෞද්ධ ආයතන 38 ක් ස්ථාපිත ව තිබේ. ඒ අතරින් ස් චුවැන් පළාතේ ඒ මෙයි ශැන් බෞද්ධ ආයතනය උසස් පෙළේ ප්‍රසිද්ධ ම එකකි. ඒ මෙයි ශැන් කඳු පාමුලේ පිහිටි එම ආයතනයට වසර 90 ක ඉතිහාසයක් හිමි වෙයි. පිහිටුවූ දා සිට ම එම ආයතනය පුද්ගලාන්තර බුද්ධාගම යන සංකල්පය අනුගමනය කරමින් සිටී. එම ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ලුං සාන් ස්වාමීන් වහන්සේගේ විස්තරයට අනුව, පුද්ගලාන්තර බුද්ධාගම යන සංකල්පය බුද්ධාගම නූතන විකාශනයේදී ඓතිහාසික තේරීමක් වශයෙන් හැඳින්විය හැක. එමෙන් ම චීනයේ සත්‍ය තත්වයට හා ඓතිහාසික වර්ධනයට ගැලපෙන තේරීමක් ද වෙයි. එම සංකල්පයේ නායකත්වය යටතේ චීන බෞද්ධ ක්ෂේත්‍රය සංස්කෘතික, අධ්‍යාපන සහ පුණ්‍ය සංවර්ධනය වැදගත් කොට සලකයි.

වර්තමානයේ චීන බෞද්ධ ආයතනවල අධ්‍යාපනය ක්‍රමයෙන් සමාජීය අධ්‍යාපනයට ගැලපෙමින් තිබේ. ඒ මෙයි ශැන් බෞද්ධ ආයතනයේ සිසු සංඛ්‍යාව 100 ක් ඉක්මවා තිබේ. එහි අධ්‍යාපනයට පාසල් පදනම් පාඨමාලාව, උපාධි පාඨමාලාව සහ පාශ්චාත් උපාධි පාඨමාලාව යන මට්ටම් 3 ක් ඇතුළත් වෙයි. ඒ පමණක් නොව එම ආයතනය බෞද්ධ අනුගාමියන්ට හා උපාසකයන්ට පුහුණුව ද ලබා දෙයි.









ඉදිරිපත් කිරීම : චාං යෝ යෝ









# හරිත සංවර්ධනයට චීනයේ දායකත්වය

මෑත වසර කිහිපය තුළ හරිත සංවර්ධනය හා ජෛව සුරක්ෂිතතාව සඳහා චීනය විශාල දායකත්වයක් ලබා දී ඇත. ඒ, නව සැලසුම් හා ආර්ථික වර්ධන ව්‍යුහය මගින්.

චීනයේ 7 වැනි විශාලතම කාන්තාරය වන කුබුචි කාන්තරය පිහිටා තිබෙන්නේ චීනයේ ඇතුළු මොංගෝලියානු ස්වායත්තයේය. එම කාන්තාරයේ සමස්ත භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර් 18 දහසකි. දැනට එම කාන්තාරයේ භූමි ප්‍රමාණයෙන් තුනෙන් එකක භූමිය හරිත කලාපයක් බවට පත්කර තිබේ. ලෝක වන ආවරණ අනුපාතය ඉහළයාමේ වැදගත් හේතුවක් වන්නේ චීනය වන රෝපණ කටයුතු විශාල වශයෙන් සිදු කිරීමයි.

හරිත, අඩු කාබන්, ප්‍රතිචක්‍රීයකරණය හා අඛණ්ඩව වර්ධනය කළ හැකි නිෂ්පාදන හා ජීවන ක්‍රමය තුළින් චීනය හරිත සංවර්ධනයට හා ජෛව සුරක්ෂිතතාව සඳහා දැනට ක්‍රියාකාරීව දායක වෙමින් සිටියි. 2030 වන විට දේශීය නිෂ්පාදන තුළින් කාබන් ඩයොක්සයිඩ් වායු විමෝචනය 2005 වසරේ සිදු කළ ප්‍රමාණයෙන් සියයට 60 ක හෝ 65කින් අඩු කරන බවට චීනය ප්‍රතිඥා දී ඇත. පසුගිය වසර තුනක කාලය තුළ ලෝක කාබන් විමෝචන ප්‍රමාණය වැඩි නොකිරීමේ හේතුව චීනය ලබා දුන් විශාල දායකත්වය බව බොහෝ විශේෂඥයෝ පවසති.

ගල් අඟුරු, ඛනිජ තෙල් යන බලශක්ති සම්පත් වායු දූෂණය හා ව්‍යුහය වෙනස් වීමෙන් පවිත්‍ර බලශක්ති සංවර්ධනය කිරීමේ චීනය නියැළි සිටියි. වසර කිහිපයක සිට අඛණ්ඩව තාක්ෂණ නවීකරණයන් මගින් ප්‍රතිචක්‍රීයකරණ සම්පත් නිෂ්පාදනයේ ප්‍රමුඛ ස්ථානයක චීනය සිටිති. ඒ අනුව ලෝකයේ ප්‍රතිචක්‍රීයකරණ සම්පත් නිෂ්පාදන විශාල රටක් බවට මේවන විට චීනය පත්ව තිබේ.

චීනය විදෙස් රටවල ව්‍යාපෘති ක්‍රියාත්මක කරන විට හරිත සංවර්ධනය හා ජෛව සුරක්ෂිත ක්‍රම අනුගමනය කරයි. කෙන්යාවේ නයිරෝබි අගනුවර සිට නැගෙනහිර අප්‍රිකාවේ විශාලතම වාරය වන මොම්බාසා දක්වා මොම්බාසා-නයිරෝබි දුම්රිය මාර්ගය චීනය විසින් ඉදි කරනු ලැබීය. බලශක්ති පිරිමැසීම, අවම දූෂණ නව දුම්රියක් ලෙස එම දුම්රිය මාර්ගය ඉදිකිරීමේදී කෙන්යාවේ ජෛව පරිසරය සුරක්ෂිත කිරීමේ අවශ්‍යතාව කෙරෙහි චීනය අවධානය යොමු කළේය. එම ප්‍රදේශයේ වන සතුන් විශාල ප්‍රමාණයක් සිටියහ. දුම්රිය මාර්ගය ඉදිකිරීමේදී සතුන්ගේ ජීවිත වලට බලපෑම් අඩු කිරීම සඳහා අදාළ චීන සමාගම් විවිධ පියවර ගත්තේය. දැනට එම දුම්රිය මාර්ග අසල අලි වැනි සත්ව විශේෂ නිදහසේ සැරිසරන දර්ශන දැකිය හැකිය. එමගින් සත්ව ජීවිත වලට බලපෑම් නොවන බව කෙන්යාවේ පරිසර හා ස්වභාවික සම්පත් උප අමාත්‍යවරයා සඳහන් කළේය.















ඉදිරිපත් කිරීම : සුන් ජියා ජියා

# චීනයේ ගුවෝ ලෝ ටිබෙට් ස්වායත්ත ප්‍රදේශයේ ගෙසර් සංස්කෘතිය

ක්‍රි.පූ. 8-9වැනි සියවස අතර ජීවත් වූ හෝමර් පැරණි ග්‍රීක කවියෙකි. ඔහුගේ ලෝප්‍රකට "හෝමර් මහා කාව්‍යයෙන් " බටහිර ලෝකයේ සංස්කෘතිය, ආගම සහ සදාචාර පද්ධතියට විශාල බලපෑම් ඇති විය. ක්‍රි.පූ. 5-6වැනි සියවස අතර කාලයේ චීනයට අයත් ටිබෙට් ප්‍රදේශයේත් ඒ හා සමාන මහා කාව්‍යයක් බිහි විය. ටිබෙට් වැසියන් විසින් සාමූහික ව නිර්මාණය කළ "ගෙසර් රජු ", ඒ වීර කාව්‍යයේ තේමාව ය. මේ වීර කාව්‍යය කවි පෙළ ලක්ෂ 10කින් හා අක්ෂර කෝටි 2කින් යුක්ත ය. එය, මේ වන විට ජනතාව අතර ප්‍රචලිත වෙමින් තිබෙන, ලෝකයේ එකම ඓතිහාසික මහ කාව්‍යය බවට පත් ව තිබේ. "ගෙසර් රජු " වීර කාව්‍යය යුනෙස්කෝ සංවිධානය විසින් ද්‍රව්‍යාත්මක නොවන සංස්කෘතික උරුමයක් වශයෙන් නම් කර තිබෙන්නේ ඒ නිසාවෙනි.

වත්මන් කාලයේ මේ වීර කාව්‍යය වඩාත් ප්‍රචලිත කිරීමේදී චීනයේ ජිං හයි පළාතේ ගුවෝ ලෝ ටිබෙට් ස්වායත්ත ප්‍රදේශය සඳහන් නොකර ම බැරිය. ටිබෙට් පුරාවෘත්ත අනුව ක්‍රි.ව.1038වේ උපත ලැබූ ගෙසර් රජු ජීවිතය පුරාම ටිබෙට් ජනතාවගේ සුබසෙත වෙනුවෙන් සටන් බිමේ විවිධ දුෂ්ට බලවේග සමඟ අරගල කළ වීරයෙකි. ඔහු ටිබෙට් ස්වායත්ත ප්‍රදේශයේ ගෝත්‍ර 150ක් පමණ එක්සත් කරමින් ජනතාවට සාමය හා නිදහස උදා කර දුන්නේ ය. ගෙසර් රජු පිළිබඳ ශ්‍රේෂ්ඨ ග්‍රන්ථ 120ක් පමණ පරම්පරාවෙන් පරම්පරාවට පැවත ආවේ ය. එම ග්‍රන්ථ මුලින්ම බිහි වූයේ ගුවෝ ලෝ ප්‍රදේශයෙන් බව ඉතිහාස පොතපත සඳහන් කර ඇත.

මේ වන විට "ගෙසර් රජු " වීර කාව්‍යයට සම්බන්ධ ව පර්යේෂණ මධ්‍යස්ථානයක්, සංස්කෘතික කෞතුකාගා -රයක් සහ පුස්තකාලයක් ගුවෝ ලෝ ටිබෙට් ස්වායත්ත ප්‍රදේශයේ ස්ථාපිත කර ඇත. මීට අමතරව "ගෙසර් රජු " වීර කාව්‍යයේ ගම්මානය වශයෙන් නම් කර ඇති ගම්මානයකුත් එහිදී තිබේ. ගම්වැසියෝ සියල්ලන් ම එදිනෙදා ජීවිතයේදී "ගෙසර් රජු " වීර කාව්‍යය ගීතයෙන් ගායනා කිරීමට පුරුදු ව සිටිති. චීන රජයේ අනුග්‍රහ යටතේ ගුවෝ ලෝ හිදී ගෙසර් සංස්කෘතික කලාපයක් ගොඩ නගා ඇත.

ජෛව පරිසර සංරක්ෂණය මෙන් ම ගුවෝ ලෝ ප්‍රදේශයේ ගෙසර් සංස්කෘතික පරිසරය ද හොඳින් ආරක්ෂා කළ යුතු බව ගුවෝ ලෝ සංස්කෘතික







පරිපාලනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ, ගුවෝ ලෝ ගෙසර් සංස්කෘතික මධ්‍යස්ථාන අධ්‍යක්ෂ චුවෝ චි දවෝ චියේ මහතා කියා තිබේ. පසුගිය මාර්තු මාසයේ ගුවෝ ලෝ චීන ජාතික මට්ටමේ ගෙසර් සංස්කෘතික ආරක්ෂක කලාපය බවට පත් කිරීමට චීන සංස්කෘතික අමාත්‍යාංශය පියවර ගෙන ඇත.





මේ වන විට ගෙසර් සංස්කෘතිය ප්‍රවර්ධනය වෙනුවෙන් ගුවෝ ලෝ ටිබෙට් ස්වායත්ත ප්‍රදේශය පියවර රැසක් ගෙන තිබේ. "ගෙසර් රජු" වීර කාව්‍යය රචනයෙන් , ගීත ගායනයෙන් සහ චිත්‍ර කලාවෙන් ප්‍රචලිත කිරීමට ප්‍රදේශයේ දක්ෂ කලා ශිල්පීහු 200කට වැඩි පිරිසක් කටයුතු කරමින් සිටිති. ගෙසර් සංස්කෘතික බලපෑම් ගුවෝ ලෝ ප්‍රදේශයේ ළමුන්ටත් ඇති වී තිබේ. එහි කදිම ප්‍රතිඵලයක් වශයෙන් 2016 වසරේ ගුවෝ ලෝ ප්‍රදේශයේ ටිබෙට් සිසුන් 32 දෙනෙකුගෙන් සමන්විත ගෙසර් ළමා ගායන කණ්ඩායමට බෙයිජිංහි පිහිටි චීන මහජන මහ ශාලාවේ වේදිකාවට නැගීමේ අවස්ථාවක් ලැබිණ. ඔවුහු එම වේදිකාවේදී ගායනා කරමින් ගෙසර් රජුගේ කතන්දර විචිත්‍ර ව ප්‍රේක්ෂකයන්ට කියා දුන්හ.

ටිබෙට් සංස්කෘතික උරුමයක් වශයෙන් "ගෙසර් රජු" වීර කාව්‍යය වත්මන් යුගයේ චීනය ටිබෙට් බුදු දහමේ ආභාස ලැබූ රටවල් හා ප්‍රදේශ සමඟ සංස්කෘතික බැඳීම් ශක්තිමත් කිරීමේ මාර්ගයක් බවට පත් වී ඇත. මේ වන විට මේ වීර කාව්‍යය මොංගෝලියාව, රුසියාව, ඉන්දියාව, නේපාලය හා පාකිස්ථානය ඇතුළු රටවලට ව්‍යාප්ත වී තිබේ. චීන රජයේ සහය යටතේ ගෙසර් සංස්කෘතික බලපෑම් ලොව පුරා තව තවත් පුළුල් වනු ඇත.



ඉදිරිපත් කිරීම : ෂෙං ලී



# කාබනික වගා නිෂ්පාදනයෙන් සාර්ථක වූ චීනයේ 'යැන් බ්‍යැන්' ප්‍රදේශයේ වී ගොවිතැන

ඊසාන දිග චීනය වැදගත් කෘෂිකර්ම කලාපයක් ලෙස ප්‍රසිද්ධය. එය 'කළු පැහැති පාංශු සතු භූමියක්' ලෙස විරුදාවලි ලබා ඇත. මෙයින් එහි පාංශු වර්ගය වගාවන්ට පෝෂණීය බව කියැවෙයි.

ඊසාන දිග චීනයේ 'යැන් බ්‍යැන්' කොරියානු ජාතික ස්වායත්ත කෝරළයේ ස්වභාවික හා ජෛව පරිසරය ඉතාම සුන්දරය. පෝෂණීය පසත්, සම්ප්‍රදායික වී වගා තාක්ෂණයත් නිසා එහි වී නිෂ්පාදනයට චීනයේ පමණක් නොව, ජපානය තුළත් හිමි වන්නේ ප්‍රමුඛ ස්ථානයකි. එහෙත් පසුගිය වසර කිහිපය තුළ ඇතැම් ගැමියන් රසායනික පොහොර සහ කෘමිනාශක අයුතු ලෙස භාවිත කිරීමෙන් යැන් බ්‍යැන්හි වී නිෂ්පාදනයේ කීර්තියට හානියක් සිදු විය. මෙම තත්වයට මුහුණ දීම පිණිස දැනට එහි කාබනික වී වගා ක්‍රමයක් හඳුන්වා දී තිබේ. ඒ කුඹුරු තුළ කකුළුවන් හෝ තාරාවන් ඇති කිරීමේ ක්‍රමයය.

කුඹුරු තුළ කකුළුවන් ඇති කිරීම නිදසුනක් ලෙස ගතහොත්, කකුළුවන්, වන තණ සහ කෘමීන් ආහාරයට ගැනීමට පුරුදුය. එමගින් කුඹුරු තුළ තිබෙන වන තණ සහ වී වගාවට හානි වන කෘමීන් කකුළුවන් විසින් ආහාරයට ගනු ලැබෙයි. එමෙන්ම කකුළුවන්ගේ අසූචි සහ වෙනත් ශ්‍රාවයන්, මූලිකවම වී වගාවන්ට යහපත් කාබනික පොහොර ලෙස භාවිත කිරීමට හැකිය.

'යැන් බ්‍යැන්' ප්‍රදේශයට කුඹුරු තුළ කකුළුවන් ඇති කිරීමේ කාබනික තාක්ෂණය හඳුන්වා දී ඇත්තේ සීමා සහිත 'වැන් හේ' කෘෂිකර්ම සංවර්ධන සමාගම විසිනි. ජලජ නිෂ්පාදිත ඇති කිරීම, වී වගාව, කෘෂිකර්ම නිෂ්පාදන පිරිසැකසීම, අලෙවිය එම සමාගම යටතේ සිදු කෙරේ.

මෙම සමාගම, ගම්මානවල සහයෝගතා ප්‍රජාව සහ ගැමියන්, සහයෝගතා තුන් පාර්ශ්වයන් ලෙසට, කොන්ත්‍රාත්තුවට අත්සන් කරයි. ගැමියන්ට තමාගේ කැමැත්තට ගම්මානයේ සහයෝගතා ප්‍රජාවට එක් වී සමාගමත් සමග සහයෝගතා ගිවිසුමට අත්සන් කළ හැකිය. ගිවිසුමට අනුව සමාගම කකුළුවන්, වී බීජ සහ අදාළ තාක්ෂණය ගැමියන්ට සපයා දෙයි. එමෙන්ම වී අස්වැන්න සහ කකුළුවන් අස්වැන්න ගැමියන්ගෙන් මිළට ගැනීමත් ඒවා පිරිසැකසීමෙන් පසු වෙළෙඳපොලට අළෙවි කිරීමත් සමාගම භාර ගෙන තිබේ. එමගින් ඉහළ ගුණාංගයක් ඇති කාබනික වී සහ කකුළුවන් සමකාලීන වශයෙන් නිෂ්පාදනය කළ හැකිය. ගැමියන්ට ද නිෂ්පාදන අලෙවිය පිළිබඳව කිසිදු අසීරුතාවකට මුහුණ දීමට සිදු නොවේ.

යැන් බ්‍යැන් ප්‍රදේශයේ කෝරළ 8ක ගැමි පවුල් 500කට පමණ මේ වන විට කුඹුරු තුළ කකුළුවන් ඇති කිරීමේ ක්‍රමය හඳුන්වා දී ඇත. වී නිෂ්පාදනය සහ කකුළුවන් නිෂ්පාදනය එකට සිදු කරන නිසා කුඹුරු හෙක්ටාරයක ආර්ථික ප්‍රතිලාභය පෙර තිබූ චීන යුවාන් 8000ක සිට දැනට දස දහසක් බවට වර්ධනය වී තිබීම ඇත්තටම ජයග්‍රහණයකි.

















ඉදිරිපත් කිරීම : ලියු හුයි

# Wechat ජංගම දුරකථන මෘදුකාංගය හා නව තාක්ෂණ ක්‍රමවේද චීන පොලීසියේ සේවාවන් තවදුරටත් පහසු කරයි

නව අන්තර්ජාල තාක්ෂණය මඟින් අපේ ජීවිතයට බොහෝ පහසුකම් සළසා දී තිබේ. එමෙන්ම, මෙම නව අන්තර්ජාල තාක්ෂණය අප සමාජයේ විවිධ ක්ෂේත්‍රවලට බලපා ඇත.

චීනයේ ලිඕ නිං පළාත උදාහරණයක් ලෙස සඳහන් කළහොත්, එහි විවිධ නගරවල ඇති පොලීස් දෙපාර්තමේන්තුවල නව අන්තර්ජාල තාක්ෂණය ප්‍රයෝජනය ගනිමින් රාජකාරි සිදු කරයි. එමගින් කාර්යක්ෂමතාව ඉහළ නැංවා තිබේ. මේ නව තාක්ෂණය පිළිබඳව සඳහන් කරන විට ශ්‍රී ලාංකිකයින් බහුලව භාවිත කරන whatsapp වැනි wechat නැමැති ජංගම දුරකථන මෘදුකාංගය චීනය පුරා ම ජනප්‍රිය වී ඇත. චීනයේ විවිධ ක්ෂේත්‍රවල මෙන් සාමාන්‍ය ජනතාවගේ දෛනික ජීවිත ද wechat නිසා බොහෝ පහසු වී තිබේ.

ලිඕ නිං පළාතේ ෂෙන් යිං නගරයේ පොලිස් ස්ථානයක පොලිස් නිළධාරීන් 10 දෙනෙකුගෙන් සමන්විත විශේෂ කණ්ඩායමක් ස්ථාපිත කර ඇත. නව අන්තර්ජාල තාක්ෂණයෙන් එසේත් නොමැති නම් wechat ඔස්සේ තොරතුරු විමසීම, විවිධ සේවාවන් සැපයීම හා හදිසි සිද්ධීන් පිළිබඳ දැනුවත් කිරීම ඇතුළු සේවාවන් සැපයීම මේ කණ්ඩායමේ ප්‍රධාන රාජකාරියයි. සුනඛයින්ගේ හැඳුනුම්පත් නිකුත් කිරීම වැනි ක්‍රියාව උදාහරණයක් ලෙස සඳහන් කළ හැකියි. මෙම නව තාක්ෂණ කණ්ඩායම ස්ථාපිත කිරීමට පෙර ජනතාව තමන්ගේ ම සුනඛයා රැගෙන පොලිස් ස්ථානයට පැමිණ ඡායාරූපයක් ගෙන ලියා පදිංචි කළ යුතුයි. නමුත් දැන් ජනතාව ජංගම දුරකථනයෙන් තම සුනඛයාගේ ඡායාරූපය ගෙන wechat ඔස්සේ පොලිස් ස්ථානයට යවා තම අයදුම්පත පිරවීමට පෙළඹී තිබේ. පසු දිනක පොලිස් ස්ථානයට ගොස් සුනඛයාගේ හැඳුනුම්පත ලබා ගත හැකියි.

එමෙන්ම පැය 24 පුරා ම wechat ඔස්සේ හදිසි සිදුවීම් පිළිබඳ දැනුවත් කිරීම සඳහා ජනතාවට හැකියාවක් ඇත. මේ සමඟ, හදිසි සිදුවීම් විසඳා ගැනීමට වැය වන කාලය අවම කිරීමට හැකි වී තිබේ. එමෙන්ම ආබාධිත පුද්ගලයන්ට මේ හරහා ලැබී ඇත්තේ මහත් පහසුවකි.



ඉදිරිපත් කිරීම : වං යිං













# සරළ මෙන්ම පිරිසිදු ගායකයා චෞ ලෙ

සංගීතය විශ්ව භාෂාවකි. භාෂාව කුමක් වුවද සංගීතයේ රස අපි සෑම දෙනෙකුටම විඳිය හැකි ය. ගීතයක් ඇසීමෙන් අපට ගායකයාගේ හැඟීම්, සංකල්ප හා අදහස් හොඳින් දැනගත හැකි ය. ඇතැම් විට ජීවිතය හෝ අනෙකුත් දේවල් පිළිබඳ ගායකයාගේ අදහස් හා අප සිතන අදහස සමාන වුවහොත් එම ගායකයාගේ ගීතය අසා සිටින විට අප බොහෝවිට ඉක්මණින් ඒ ගීතයට සංවේදී වනු ඇත. මේ සටහන චීනයේ ජීවත්වන එවැනි ගායකයෙක් පිළිබඳව ය. ඔහුගේ නිර්මාණ නිරන්තරයෙන් තරුණයන්ගේ සිත් ඇදගන්නා සුළුය. මේ ගායකයාගේ නම චෞ ලෙ ය.

මේ දිනවල චෞ ලෙ චීනයේ ක්‍රමයෙන් ප්‍රසිද්ධ වෙමින් සිටී. මේ වන විට ඔහු ගීත ඇල්බම් තුනක් නිකුත් කර ඇත. සෑම ඇල්බමයකම ඉතා ජනප්‍රිය ගීත තිබේ. නිදසුනක් ලෙස 2011 වසරේ නිකුත් කළ ඇල්බමයේ දකුණු ප්‍රදේශයේ ජීවත්වන තරුණිය නැමැති ගීතය හා අක්කාට යවන ලියුමක් නැමැති ගීතය, එමෙන්ම 2016 වසරේ නිකුත් කළ ඇල්බමයේ චෙං ඩු නැමැති ගීතය, චීන තරුණ පරපුර අතර ඉතා ජනප්‍රිය ය. මේ වසරේ චෞ ලෙ චීනයේ ප්‍රකට විනෝදාත්මක වැඩසටහනට සහභාගි විය. එහිදී ඔහු ඉතා සංවේදී මෙන්ම මිහිරි තාලයෙන් යුතු ගී පද සහිත චෙං ඩු නම් ගීතය ගායනා කළේ ය. එය අද වන විට චීනයේ අන්තර්ජාලයේ ඉතා වේගයෙන් ජනප්‍රිය වී ඇත.

චීනයේ බෙයිජිං නගරයේ උපත ලැබූ චෞ ලෙ ගේ ජීවිතයට, බෙයිජිං නගරයේ ඇති මහා සංස්කෘතිය බලපා ඇත. එමෙන්ම එම බලපෑම ඔහුගේ සංගීත නිර්මාණවලින්ද දැකිය හැකි ය. ජීවිත අත්දැකීම් පිළිබඳ විස්තරවලින් ඔහු රචනා කරන ගී පද සමන්විත වේ. දෛනික ජීවිතයේ ඇසු දුටු දේ අනුව ඔහු එම ගීත නිර්මාණය කරන අතර, ඔහු දකින සාමාන්‍ය ජීවිතයේ ඉතා සුළු සිදුවීම් වුවද හැඟීම් දැනවෙන අයුරින් ඔහුට රචනා කළ හැකිය. මෙම ගී පද වලින් ඔහුගේ ජීවිතය පිළිබිඹු වනවා යැයි පැවසීම සත්‍යයකි. මෙම ගී පද හා සංගීතය මගින් පිළිබිඹු වන්නේ ජනතාවගේ පොදු හැඟීම් ය. ජීවිත අත්දැකීම් පදනම් වූ නිර්මාණ ඉතාම ආකර්ෂණීය මෙන්ම ඊට මිනිසුන්ගේ හැඟීම් ස්පර්ෂ කළ හැකි බවට විශ්වාස කෙරේ.

චෞ ලෙ චීනයේ විවිධ ප්‍රදේශවල සංචාරය කිරීමේ අත්දැකීම් හිමි වීමෙන් ඔහුගේ මේ විශේෂ සංගීත රටාව හැඩ ගසා තිබේ. 2007 වසරේ 21 හැවිරිදි චෞ ලෙ තනිවම චීනයේ ස්චුවාන් පළාතේ, යුන්නැන් පළාතේ හා ටිබෙට් ස්වායත්තයේත් සංචාරය කළේ ය. බෙයිජිං නගරයට ගමන් කරන දුම්රිය නම් ගීතය හා වසන්ත ඍතුව අල්ලා ගැනීම නම් ගීත ඇතුළු ගීත කිහිපයක් ඔහු එම සංචාරයේදී නිර්මාණය කර ඇත. සාමාන්‍යයෙන් අප සංචාරය කරන්නේ විනෝදය ලබා ගැනීම සඳහාය. එසේත් නොමැති නම්, මානසික සහනයක් ලබා ගැනීම සඳහා ය. නමුත්, චෞ ලේගේ සංචාරයන් වෙනස් වන්නේ, වෙනස්වන ජීවිතයන් හා විවිධ දර්ශන දැකීමෙන් ලද අත්දැකීම්. අනෙකුත් මිනිසුන් සමඟ හුවමාරු කරගන්නේ සංගීතය හරහා වීමෙනි. ඕනෑම දෙයකට අනුප්‍රාණයක් සොයා ගැනීම චෞ ලෙ ගේ අරමුණ බවට පත්ව ඇත. සංචාරයේදී ඇසු දුටු දේ හා අත්දැකීම් මගින් සැබෑවින්ම ඔහුගේ සංගීත නිර්මාණය පෝෂණය වී තිබේ.

චෞ ලෙගේ සෑම ගීතයක්ම සත්‍ය කතන්දරයකි. ඔහුගේ ගීතය සංවේදී නිර්මාණය බවට පත් වන්නේ ගීතයේ සත්‍ය කතන්දර ඇති හේතුවෙනි. චෞ ලෙ මෙම ආකල්පය රඳවා ගනිමින් අඛණ්ඩව ගීත නිර්මාණය කළහොත් ඉදිරියේ වඩාත් සංවේදී ගීත බිහි වනු නොඅනුමානය.



ඉදිරිපත් කිරීම : වෙන් ගුවැන් වන්







# 在百货商店 - බහුභාණ්ඩ වෙළඳ සැලකදී

## 今日关键 අද පාඩමෙන් අවධානය

| | |
|---|---|
| 我想买一个小冰箱。 | වෝ ෂිආං මැයි යී ග ෂෞ බින්ග් ශ්‍යාං.<br>මට අවශ්‍යයි කුඩා ශීතකරණයක් මිළදී ගන්න. |
| 哪种质量最好？ | නා චුං චර්ලිඅන් ස්වේයි හාඕ?<br>කොයි වර්ගයක තත්ත්වය හොඳයි ද? |
| 它的噪音特别小。 | තා ද සෞයින් ටබියැ ස්ෂෞ.<br>මේකේ ශබ්දය ඉතාම අඩුය. |
| 别的店更便宜。 | බියැ ද දියැන් ගෙන්ග් පිඇන් යී.<br>අනිත් වෙළඳ සැල් වල ගොඩක් ලාබයි. |
| 能送货吗？ | නෙන්ග් සුං හෝ මා?<br>පුළුවන් ද භාණ්ඩය ප්‍රවාහනය කරන්න? |
| 能用信用卡吗？ | නෙන්ග් යුං ෂින් යුං කා මා?<br>පුළුවන් ද පාවිච්චි කරන්න ණය පත? |

## 完整对话 සම්පූර්ණ සංවාදය

### 对话 一 පළමු සංවාදය

| | |
|---|---|
| 欢迎光临。 | හුඅැන් යින්ග් ගුවන් ලින්.<br>ආයුබෝවන්. |
| 我想买一个小冰箱。 | වෝ ෂිඅන් මැයි යී ග ෂෞ බින්ග් ශ්‍යාං.<br>මට අවශ්‍යයි කුඩා ශීතකරණයක් මිළදී ගන්න. |
| 哪种质量最好？ | නා චුං චර්ලිඅන් ස්වේයි හාඕ?<br>කොයි වර්ගයක තත්ත්වය හොඳයි ද? |
| 质量都不错。 | චර්ලිඅන් ඩෞ බූ ස්සුවෝ.<br>තත්ත්වය නං ඔකොම හොඳයි. |

### 对话 二 දෙවන සංවාදය

| | |
|---|---|
| 哪种是最新款的？ | නා චුං ෂ ස්වේයි ෂින් කුවැන් ද?<br>කොයි වර්ගයක් අලුත්ම එක? |
| 这个是今年的新款。 | චර් ග ෂ පින් නිඇන් ද ෂින් කුවැන්.<br>මෙක මේ අවුරුද්දේ අලුත්ම වර්ගය. |
| 它的优点是什么？ | තා ද යුව් දියැන් ෂ ෂෙන් ම?<br>එකේ විශේෂත්වය මොනවා ද? |
| 它的噪音特别小。 | තා ද සෞයින් ටබියැ ස්ෂෞ.<br>මේකේ ශබ්දය ඉතාම අඩුය . |

### 对话 三 තෙවන සංවාදය

| | |
|---|---|
| 别的店更便宜。 | බියැ ද දිඇන් ගෙන්ග් පිඇන් යී.<br>අනිත් වෙළඳ සැල් වල ගොඩක් ලාබයි. |
| 我们不能再便宜了。 | වෝමෙන් බූ නෙන්ග් ස්සැයි පිඇන් යී ල.<br>අපට තවත් අඩු මිලට දෙන්න බෑ. |
| 1500元是最低价格。 | යී චිඇන් වු බැයි යුඅන් ෂ ස්වේයි දි ජ්‍යා ග.<br>අඩුම වශයෙන් යුඅන් 1500ක්. |

### 对话四 සිව්වන සංවාදය

| | |
|---|---|
| 能用信用卡吗？ | නෙන්ග් යුං ෂින් යුං කා මා?<br>පුළුවන් ද පාවිච්චි කරන්න ණය පත? |
| 可以。 | ක ඉ.<br>පුළුවන්. |
| 能送货吗？ | නෙන්ග් සුං හෝව් මා?<br>පුළුවන් ද භාණ්ඩය ප්‍රවාහනය කරන්න? |
| 请告诉我您的地址和电话。 | චින්ග් ගාඕ සු වෝ නින් ද දිචර් හ දියැන් හුවා.<br>ඔබේ ලිපිනය හා දුරකථන අංකය මට කියන්න. |

### චීන සංස්කෘතියෙන් බිඳක්

ආහාර වේලක ඇති පෝෂ්‍යදායී ගුණය පිළිබඳව බටහිර ලෝකයේදී වැඩි අවධානයක් යොමු වෙනවා. හොඳ පෝෂ්‍යදායී වටිනාකමක් සහිත ආහාර වේලක් යනු බටහිරදී ඉතාම ඉහළ තත්ත්වයෙන් යුතු කෑම වේලකටයි. පෝෂණ ගුණය පිළිබඳ ඔවුන් දක්වන මේ උනන්දුව නිසාම සමහර එළවළු ආහාරයට ගන්නේ අමු වෙනුයි. තක්කාලි, පිපිඤ්ඤා හා සළා ද කොළ විතරක් නෙවෙයි ගෝවා, ලූණු, මල් ගෝවා වැනි එළවළු වර්ගත් බටහිර වැසියන් අමුවෙන් ආහාරයට ගන්නේ පිසීමෙන් ඒවායේ ඇති පෝෂණ ගුණය නැති වෙන නිසයි.

චීන කියමනක් තියෙනවා ‘රසයෙන් මූළික වන ආහාර මිනිසුන්ගේ ජීවිත වල පදනමයි’ කියලා. ඉන් පැහැදිලි වෙන්නේ චීන මිනිසුන් තමන් පිසින ආහාර වල පැහැය, රසය, සුවඳ වගේම හැඩය පිළිබඳවත් දැඩි උනන්දුවක් දැක්වූ බවයි. ප්‍රණීත ආහාර පිසීමේදී චීනයේ භාවිතා වන ප්‍රධාන රසකාරක පහක් තියෙනවා. කෙසේ වෙතත් දැඩි උණුසුමෙන් ආහාර පිසීමේදී ආහාර වල පෝෂණ ගුණය නැතිවීම නම් වළක්වන්න බැහැ. නමුත් වර්තමානය වන විට ආහාර වල රසය වගේම ගුණයත් රැකෙන අන්දමින් එම අහාර පිස ගැනීම පිළිබඳව බොහෝ දෙනෙක් උනන්දුවක් දක්වන්නේ මේ අහාර සංස්කෘතියේ දියුණුව නිසායි.





# 在书店 - පොත් සාප්පුවකදී

## 今日关键 අද පාඩමෙන් අවධානය

| | |
|---|---|
| 哪儿有大的书店？ | නාර් යුව් දා ද ෂු දිඇන්?<br>කොහෙද තියෙන්නේ ලොකු පොත් සාප්පුවක්? |
| 我要买本字典。 | වෝ යෞ මැයි බෙන් ත්ස් දිඇන්.<br>මට අවශ්‍යයි මිළදී ගන්න ශබ්දකෝෂයක්. |
| 我想买本北京导游手册。 | වෝ ෂිඅන් මැයි බෙන් බෙයි පිං ඩෞ යුව් ෂෞ ත්ස.<br>මම අවශ්‍යයි මිළදී ගන්න බෙයිජිං මාර්ගෝපදේශක අත් පොතක්. |
| 请问英文小说在几层卖？ | චින්ග් වෙන් ඉං වෙන් ෂෞ ෂුවෝ සයි පි ස්සන්ග් මැයි.<br>කරුණාකර අහන්නේ ඉංග්‍රීසි නවකථා විකුණන්න තියෙන්නේ කී වෙනි මහලේ ද? |

## 完整对话 සම්පූර්ණ සංවාදය

### 对话 一 පළමු සංවාදය

| | |
|---|---|
| 哪儿有大的书店？ | නාර් යුව් දා ද ෂු දිඇන්?<br>කොහෙද තියෙන්නේ ලොකු පොත් සාප්පුවක්? |
| 去王府井看看。 | චියු වංෆුජිං කැන් කැන්.<br>වංෆුජිං වලට යන්න බලන්න. |
| 那儿有个不错的书店。 | නාර් යුව් ග බූ සුවෝ ද ෂු දිඇන්.<br>එහෙ හොඳ පොත් සප්පුවක් තියෙනවා. |

### 对话 二 දෙවන සංවාදය

| | |
|---|---|
| 我要买本字典。 | වෝ යෞ මැයි බෙන් ත්ස් දිඇන්.<br>මට අවශ්‍යයි මිළදී ගන්න ශබ්දකෝෂයක් . |
| 什么字典？ | ෂෙන් ම ත්ස් දිඇන්?<br>මොන ශබ්දකෝෂයක් ද? |
| 英汉，汉英双向字典。 | ඉං හැන්, හැන් ඉං ෂුවන්ග් ෂ්‍යං ත්ස් දිඇන්.<br>ඉංග්‍රීසි චීන, චීන ඉංග්‍රීසි ශබ්දකෝෂය. |
| 还需要什么吗？ | හැයි ෂියු යෞ ෂෙන් ම මා?<br>තව මොනවා ද ඕනේ? |
| 还要一本汉语成语字典 | හයි යෞ යී බෙන් හැන් යු චෙන්ග් යු ත්ස් දිඇන්.<br>චීන පිරුළු ශබ්දකෝෂයකුත් ඕනෙ. |

### 对话 三 තෙවන සංවාදය

| | |
|---|---|
| 您好。我想买本北京导游手册。 | නින් හාව්. වෝ ෂිඅන් මැයි බෙන් බෙයි පිං ඩෞඕ යුව් ෂෞ ත්ස.<br>මම අවශ්‍යයි මිළදී ගන්න බෙයිජිං මාර්ගෝපදේශක අත් පොතක්. |
| 那您直接上二层，就在电梯左边。 | නා නින් චර් පියේ ෂ්‍යාං අර් ස්සන්, පිව් ත්සයි තියැන් තී ස්වෝ බියැන්.<br>ඔබ කෙළින්ම දෙවෙනි මහළට යන්න ලිෆ්ට්ට වම් පැත්තට. |

### 对话四 සිව්වන සංවාදය

| | |
|---|---|
| 请问英文小说在几层卖？ | චින්ග් වෙන් ඉං වෙන් ෂෞ ෂුවෝ සයි පි ස්සන් මැයි?<br>කරුණාකර අහන්නේ ඉංග්‍රීසි නවකථා විකුණන්න තියෙන්නේ කී වෙනි මහලේ ද? |
| 在四层。 | සයි ස්ස ස්සන්.<br>හතර වෙනි මහලේ. |

### චීන සංස්කෘතියෙන් බිඳක්

ලංකාවේ මිතුරෙකුට කථා කරන අවස්ථාවකදී වගේම චීන මිතුරෙකුට කථා කරන විට වෙලාවක් ඇතොත් අපේ ගෙවල් පැත්තේ ඇවිත් යන්න එන්න කියලා ඔබට ඔහු හෝ ඇය ආරාධනා කළත් එය හුදෙක් සුහදතාවය පළ කිරීමට කරන ප්‍රකාශයක් මිස විධිමත් ආරාධනාවක් නොවන බව ඔබට වැටහෙනවා නේ.

මා අද ඔබට කියන්න යන්නේ වර්තමාන අධි වේගී ලෝකය හමුවේ සීඝ්‍රයෙන් වෙනස් වන චීන ජන සමාජයේ සන්නිවේදන ක්‍රමවේදයේ සිදුවී ඇති වෙනස්කම් ගැනයි. සාමාන්‍යයෙන් චීන නිවසකට ඔබ යනවා නම් ගෙහිමියාට කල් ඇතිව දැන්වීමෙන් වඩාත් පහසු වෙනවා නේ. සමහර විටෙක ඔහු හෝ ඇය නිවසේ සිටිනවා ද නැද්ද යන්න පවා ඔබට එමගින් කල් ඇතිව දැන ගැනීමට ලැබෙනවා. නමුත් වත්මන් දියුණු අධි වේගී සමාජයේදී ඥාති හිත මිත්‍රයෙකුගේ නිවසට ගොඩවීම වෙනුවට ජංගම දුරකථන කෙටි පණිවුඩයකින් හෝ විද්‍යුත් තැපැල් පතකින් ඔහුගේ හෝ ඇයගේ සුව දුක් විමසීමට මිනිස්සු පුරුදු වෙලා.

චීන කෙටි කථාව

# 晏子使楚

## කිසියම් අයෙකුට අවමන් කිරීමට පෙර ඒ අය සතු බුද්ධිය පිළිබඳවත් සැලකිය යුතුයි.







පුරාණ චීනයේ 'චී' සහ 'ජු' නම් කුඩා රාජ්‍ය දෙකක් පැවතුණි. එක් අවස්ථාවක චී පාලකයා 'යැන් ටිස්' නමැති දූතයෙක් ජු රාජ්‍යයට යවා තිබිණ.

යැන් ටිස් ඉතාම මිටිය. ඒ පිළිබඳව දැන ගත් ජු පාලකයා යැන් ටිස්ට අවමන් කිරීමට සිතුවේය. ඔහුගේ නියෝගයට අනුව, සේවකයෝ රාජ්‍ය දොරටුව අසල කුඩා ගුලක් විවෘත කර යැන් ටිස්ට ඒ තුළින් රාජ්‍යයට ප්‍රවේශ වීමට බල කළෝය. යැන් ටිස් එය ප්‍රතික්ෂේප කළේය.

'බල්ලන්ගේ රාජ්‍යයකට යනවා නම් බල්ලන්ගේ ගුලෙන් පිවිසෙන්න වෙනවා. හැබැයි මම අද ආවේ ජු රාජ්‍යයට මිස බල්ලන්ගේ රාජ්‍යයකට නම් නෙවෙයි.' පසුව රාජ්‍ය සේවකයෝ ඔහුට ප්‍රධාන දොරටුවෙන් පිවිසීමට ඉඩ දුන්හ.

ජු පාලකයා යැන් ටිස් හමු වූ අවස්ථාවේ ඔහුට මෙලෙස කීවේය:

'ඔබේ රාජ්‍යයේ වෙන කවුරුත් නැද්ද? ඔබ වගේ කෙනෙක් අපේ රටට එවා ඇත්තේ ඇයි ?'

යැන් ටිස් ගේ පිළිතුර මෙසේය:

'අපේ රාජ්‍යයේ ලින් ටිස් අගනගරයේ පමණක් පවුල් 7000ක් පමණ ජීවත් වෙනවා. සියළුම පුර වැසියන්ගේ ඇඳුම්වල අත්දිග කොටස අහස උසට ඔසවනවා නම් ඉර පෙනෙන්නේම නෑ. සියළු පුර වැසියන්ට දහඩිය දාන විට එය දැනෙන්නේ වහිනවා වගේ. අප රාජ්‍යය වෙන රාජ්‍යයන්ට දූතයන් තෝරා යවන්නේ ඒ ඒ රාජ්‍යයේ තත්වයට අනුවයි. රාජ්‍යයක පාලකයා බුද්ධිමත් නම් අපි බුද්ධිමත් කෙනෙක් යවනවා. ඔබ වගේ පාලකයෙක් නම් සාමාන්‍යයෙන් මම වගේ දූතයෙක් යවනවා.'









යැන් ටිස් සමග ජු පාලකයා සංග්‍රහයට එක් වූ අවස්ථාවේ නිලධාරීන් දෙදෙනෙක් අපරාධකරුවෙකු පාලකයා ඉදිරියට රැගෙන ආවේය. ජු පාලකයා එවිට අසා සිටියා 'මේ කොයි රාජ්‍යයේ කෙනෙක් ද? ඔහු සිදු කළ අපරාධය මොන වගේ ද' යන්න. නිලධාරීන් සඳහන් කළේ 'මේ අපරාධකරු චී රාජ්‍යයෙන් මෙහේ පැමිණි සොරෙක්' බවය. ජු පාලකයා යැන් ටිස් දෙස වපර ඇසෙන් බලමින් මෙලෙස විමසා සිටියේය:

'ඔබේ රාජ්‍යයේ අය සොරකම් කරන්නත් දක්ෂයි නේ ද?'

යැන් ටිස් ඔහුගේ අසුනෙන් නැගිට මෙලෙස පිළිතුරු දුන්නේය:

'මා දන්නා පරිදි, දොඩම් ගස් හුවායි ගඟාවට දකුණෙන් වැවෙනවා නම් ඒ පළතුර දොඩම් ලෙස හැඳින් වෙනවා. නමුත් එය හුවායි ගඟාවට උතුරෙන් වැවෙනවා නම් වෙනත් වර්ගයක පළතුරක් විය හැකියි. එය ඉතාම ඇඹුල්. මෙයට හේතුව මොකක් ද? භූමිය වෙනස්, පස වෙනස්. අපේ චී ජනතාව තම රාජ්‍යයේ සිටින විට සොරකම් කරන්නේ නෑ. නමුත් ජු රටට ඇවිල්ලා සොරකම් කරනවා නම්, ඒ ඔබේ රාජ්‍යයේ පරිසරය නිසා.'

පසුව ජු පාලකයා මෙම අවලස්සන මිටි යැන් ටිස්ට වඩාත් ගෞරවයෙන් සැලකීමට පටන් ගත්තේය. පසු කාලීනව මෙම සිදුවීම ඓතිහාසික ග්‍රන්ථවල ද සඳහන් විය.

මෙය ඇත්තටම චීන ප්‍රස්ථා පිරුළක පසුබිම් කතාවය. ඒ 'යැන් ටිස් ශී ජු'. ක්‍රමෝපායවලින් තමාට අවමන් කිරීමට සිතූ අයගේ කුමන්ත්‍රණය බිඳ දමා, පෙරළා ඒ අයටම අවමන් කිරීමට හැකි වීම මෙයින් කියැවෙයි.



ඉදිරිපත් කිරීම : ලියු හුයි

# අසන්නන්ගේ බිත්ති පුවරුව






ඩබ්. එම්. එස්. මහේෂිකා විජේසූරිය
නො. 12 බෝගස්කුඹුර,
ගුන්නෑපාන.
මහනුවර.
2017.03.14

චීන ගුවන් විදුලියේ සිංහල සේවය වෙත,

සුබ නව වසරක් වේවා ඔබ සැමට.

මා චීන ගුවන් විදුලිය සමඟ නිතර සබඳතා පවත්වන ශ්‍රාවකයෙක් වෙමි. පසුගිය කාලයේ මාගේ අධ්‍යාපන කටයුතු සඳහා වැඩි කාලයක් වැය කිරීමට සිදුවුණේ 2016 වසරේ දෙසැම්බර් මස අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටි බැවිනි. නැවතත් ඔබ ගුවන් විදුලියේ සිංහල අංශය සමඟ ශ්‍රී ලංකාව හා චීනය අතර සංස්කෘතික තොරතුරු හුවමාරු කරගනිමින් ඔබත් සමඟ දිගින් දිගටම රැඳී සිටීමට මා කැමැත්තෙන් සිටිමි.

තවද ශ්‍රී ලංකාව ඇතුළුව අපට චීන ගුවන් විදුලි සිංහල සේවය හොඳින් ශ්‍රවණය කිරීමට FM තරංග ආලා ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්ත කර දෙන ලෙස ඉල්ලා සිටිමි. තවත් ලිපියකින් හමුවන තුරු සමුගනිමි.

මිට සිතැති,
මහේෂිකා.

මාගේ ලිපිනය :-

W.M.S Maheshika Wijesooriya,
NO. 12, Boguskumbura.
Gunnopana.
Kandy.
Sri Lanka.





ඉදිරිපත් කිරීම : හාඕ ලී ෆාං

# අත්දැකීමෙන් බිඳක් ...

මෙම වසර මුල දී මා චීනයට පැමිණියේ චීනයේ සැබෑ පරිසරය පිළිබඳව විශාල අවබෝධයක් ඇතුළු නොවේ. ඒ වනවිට මා සතුව තිබුණේ චීනය ලෝකයේ විශාලතම ජනගහණයක් ජීවත් වන, වේගවත් සංවර්ධනයක් ලබා ඇති, ආසියානු කලාපයේ විශාලතම රට වශයෙන් මා දැන උගත් කාරණාත්, මාධ්‍ය තුළින් මා ඇසු දුටු කාරණාත් පමණි. ශ්‍රී ලංකාවෙන් ගුවන් යානයට ගොඩවූ මොහොතේ සිට චීනයේ බෙයිජිං ජාත්‍යන්තර ගුවන් තොටුපලින් චීනයට ළඟා වන තුරුම මා කල්පනාවේ නිමග්න වූයේ මාගේ හිතවතකු ඥාතියෙකු හෝ නොමැතිව නුහුරු නුපුරුදු පරිසරයක නුහුරු නුපුරුදු රටක මා හට ගත කරන්නට වන කාලය කෙසේ වේවිද යන්න පිළිබඳවය. නමුත්, ගුවන් තොටුපළින් චීනයට පා තැබූ මොහොතේ අපගේ සංවිධායකවරුන්ගෙන් ලද උණුසුම් පිළිගැනීම මා තුළ පැවති නොසන්සුන්කාරී සිතුවිලි සමනය කිරීමට සමත්විණ.



ඉදිරිපත් කිරීම : නිලුපුල් පෙරේරා

චීනයට පැමිණීමට පෙර සහ චීනයට පැමිණීමෙන් පසුව අද වන විට මා චීනයත්, චීන ජනතාවත්, චීනයේ සමාජ පසුබිමත්, දකින ආකාරයේ පවතින්නේ විශාල වෙනසකි. මේ කාලය තුළ මේ සියළු කාරණා පිළිබඳව ගැඹුරු අවබෝධයක් ලබා ගැනීමට මා හට හැකි විය. එයට ප්‍රධානතම හේතුව වූයේ කෙටි කාල සීමාවක් තුළ විශාල පළාත් ප්‍රමාණයක සංචාරයේ නිරතවීමටත්, ඒ එකින් එක පළාත්වල තිබෙන සුවිශේෂී සමාජ, ආර්ථික සංස්කෘතික ලක්ෂණ පිළිබඳව යම් ප්‍රමාණයක අත් දැකීම් ලබා ගැනීමටත් හැකිවීමත්‍ය.

චීනයේ විශාලත්වයට අනුව එක් පළාතක සිට තවත් පළාතකට යාම සඳහා දීර්ඝ කාලයක් ගතවේ. ඇතැම් විට එය පැය පහත් දහයත් අතරය. සමහර අවස්ථාවන් වල එය එක් රටක සිට තවත් රටකට යාමට ගතවන කාල සීමාවටත් වඩා බොහෝ දිගු කාල සීමාවකි. චීනයේ භූමි ප්‍රමාණයේ විශාලත්වය කෙතරම් ද යන්න එයින්ම ඔබට සිතා ගැනීමට හැකිය.

වර්තමානය වන විට චීන මහජන සමූහාණ්ඩුව ලෝකයේ දෙවැනි විශාලතම ආර්ථිකය හිමි රට බවට පත්ව තිබේ. චීනය සෑම අතකින්ම ලබා ඇති දැවැන්ත සහ සීඝ්‍රගාමී සංවර්ධනය දෙස බැලීමේදී එහි සත්‍යතාව මැනවින් පැහැදිලි වේ. චීන ජනතාව තුළ මා දුටු සුවිශේෂී ලක්ෂණයක් වන්නේ, ඔවුන් තම රාජකාරි ඉටු කිරීමේදී ඉතාමත් වගකීමකින් සහ කැපවීමකින් එය ඉටු කිරීමට ගන්නා උත්සාහයයි. රටක් වශයෙන් චීන ජනතාව තම රාජකාරිය කෙරෙහි දක්වන කැපවීමත්, උනන්දුවත්, චීනය ලෝකයේ දෙවැනි විශාලතම ආර්ථිකය හිමි රට බවට පත්වීමට මඟ පාදා තිබෙන බව සැබෑවකි.

අද වන විට චීනය ලෝකයේ බොහෝ රටවල් අභිබවමින් සෑම ක්ෂේත්‍රයකින්ම පාහේ විශාල ප්‍රගතියක් ලබා තිබේ. වර්තමානයේ එය එසේ වුවත් අතීතයේදී ද චීනය සතුව ඉතා දිගු හා ප්‍රෞඪ ඉතිහාසයක් තිබූ බවට බොහෝ සාක්ෂි මාගේ චීන සංචාරයේදී දැක බලා ගැනීමට හැකිවිය. බෙයිජිං නුවර පිහිටා තිබෙන අධිරාජ්‍ය මාළිගය, චීන ජාතික කෞතුකාගාරය, ගිම්හාන උද්‍යානය, එසේම චීනයේ බොහෝ පළාත් ආවරණය කෙරෙමින් විහිදී ඇති චීන මහා ප්‍රාකාරය මෙන්ම, විවිධ පළාත්වල පිහිටා ඇති පුරා විද්‍යාත්මක ස්ථාන චීනයේ එම දිගු හා ප්‍රෞඪ ඉතිහාසය පිළිබඳව සාක්ෂි සපයයි.

චීන ජන සමාජය තුළ මා දුටු විශේෂිතම ලක්ෂණයක් වන්නේ, ඔවුන් කෙතරම් සංවර්ධනයක් ලබා තිබුණද, කාර්මීකරණයෙන් සහ තාක්ෂණයෙන් ඉහළම ස්ථානයකට ගියද, ඔවුන් කෙතරම් කාර්ය බහුල වුවත්, තමන්ගේ සාම්ප්‍රදායික සිරිත් විරිත් ආදියට ප්‍රමුඛතාව ලබා දීමය. කොතරම් රාජකාරි මධ්‍යයයේ වුවද ඔවුන් තම සාම්ප්‍රදායික උත්සව පැවැත්වීම බැහැර කන්නේ හෝ නොසළකා හරින්නේ නැත. වාර්ෂිකව වරින් වර පැවැත්වෙන චීන සාම්ප්‍රදායික උත්සව සහ සැණකෙළි දෙය බැලීමේදී එය මනාව පැහැදිලි වේ. මේ සඳහා සමාජයේ සෑම තරාතිරමකම ජනතාව ඉතා උනන්දුවෙන් සහ කැපවීමෙන් යුතුව සහභාගී වේ. එසේම එම දිනවලදී හෝ තමන්ගේ සාම්ප්‍රදායට අදාළ වූ සාම්ප්‍රදායික ඇඳුම් පැළඳුම් වලින් සැරසීම ද ඔවුන් විසින් ඉතා සතුටින් සිදුකරන තවත් විශේෂ කාර්යයකි. චීනයේ තරුණ පරම්පරාව තමන්ගේ සාම්ප්‍රදායික සිරිත් විරිත් සහ උත්සව ආදියට දක්වන







උනන්දුව සහ දායකත්වය මා දකින්නේ ප්‍රශංසනීය කාරණයක් ලෙසය.

චීන සංචාරය තුළ මා හටද එවැනි උත්සව බොහොමයකට සහභාගී වී සතුටු වීමට අවස්ථාව ලැබිණ. එය හුදෙක් විනෝදයක්ම පමණක් නොව, එම උත්සව වලට සහභාගි වීම තුළින් චීනයේ සාම්ප්‍රදායික ක්‍රියාකාරකම්, සිරිත් විරිත් පිළිබඳව මා හට ලබා ගත හැකි වූ දැනුමද ඉතා විශාලය. චීන සාම්ප්‍රදායික ඇඳුමකින් සැරසීමට මා ලද අවස්ථාව කෙදිනක හෝ මගේ මතකයෙන් ඉවත්ව නොයනු ඇති.





# ස්ට්‍රෝබරි පුඩින්

ඉදිරිපත් කිරීම : වං යිං



## අවශ්‍ය ද්‍රව්‍ය

- අවශ්‍ය ද්‍රව්‍ය
- පුඩින් පැකට් 1ක්
- දියර කිරි මිලිලීටර් 560ක්
- සීනි ග්‍රෑම් 40ක්
- ස්ට්‍රෝබරි අවශ්‍ය ප්‍රමාණයට

## සාදන ක්‍රමය

- සීනි ග්‍රෑම් 40ක් හා දියර කිරි මිලිලීටර් 60ක් පමණ හොඳින් මිශ්‍ර කර පුඩින් කුඩු සමඟ බඳුනකට දමා නැවත හොඳින් මිශ්‍ර කර තබන්න.
- ඉතිරි වූ දියර කිරි මිලිලීටර් 500ක් පමණ ගෙන උණු කර තබා ගන්න.
- පෙර අප මිශ්‍ර කරගත් සීනි හා කිරි සහිත පුඩින් කුඩු මිශ්‍රණය මෙම උණු වූ කිරිවල මිශ්‍ර කිරීම අවශ්‍යයයි. මිශ්‍ර කළ පසු එය තලපයක හැඩය විය යුතු ය.
- ඉන් පසු මෙම මිශ්‍රණය තවත් විනාඩියක් පමණ උණු කිරීම අවශ්‍යයයි.
- පසුව තමන් කැමති හැඩයක් සහිත භාජනයකට එය එක් කළ යුතුයි.
- දැන් එය ශීතකරණයේ තබන්න. පැය 4කට පසු ඔබට රස බැලිය හැකියි.





# දස වන පාඩම
# තුවාල සහ ලේ ගැලීම්

තුවාලයක් යනු අප සිරුර සෑදී පවත්නා පටක අතර තිබෙන අඛණ්ඩ සබඳතාවය බිඳී යෑමයි. එසේත් නැතිනම් සම පළුදුවීමක් ලෙස ද හැඳින්විය හැකියි. එය කැපීමක්, සීරීමක්, තැලීමක් හෝ ඇනීමක් වැනි විවිධ ආකාරයේ හේතු නිසා සිදු වීමට පුළුවන.

ලොව පුරා දෛනිකව සිදුවන අනතුරු හේතුවෙන් මිනිසාට බහුල වශයෙන්ම සිදුවන හානිය වන්නේ තුවාලයි. රිය අනතුරු, ඇද වැටීම්, ගෘහස්ථ අනතුරු, ක්‍රීඩා පිටියේදී, වැඩබිමේදී වන අනතුරු, පිළිස්සීම්, යුද්ධ හා ගැටුම් ආදී විවිධ හේතු නිසා මිනිසාට වන තුවාල, අස්ථි බිඳීම්, උළුක්කු ආදී හානීන් අතරින් තුවාල ප්‍රමුඛස්ථානයක් ගනී. මෙවැනි විවිධ අනතුරු වාර්ෂිකව ලොව පුරා මිනිස් ජීවිත 5.8 ක් හෙවත් ලක්ෂ 58 ක් පමණ දෙනාගේ ජීවිත බිලි ගැනීමටත් කෝටි ගණනක් දෙනාට දිගු කාලීන හෝ කෙටි කාලීන ආබාධ හා වේදනාවන් ගෙන ඒමටත් සමත් වී ඇත. ශ්‍රී ලංකාවේ ද වසරකට ළමුන් පමණක් 270,000 ක් පමණ දෙනා රෝහල්ගත කිරීමට මෙන්ම බාල වැඩිහිටි මහලු ජීවිත 10,000 ක් පමණ වාර්ෂිකව බිලිගැනීමට ද මෙවැනි විවිධ අනතුරු හේතු වී තිබේ.

එම නිසා අප විසින් සෑම විටම අනතුරු වළක්වා ගැනීමටත් එවන් අවස්ථාවකදී ප්‍රථමාධාර කිරීමටත් උගත යුතුය. අද පාඩමෙන් ගෙන එන්නේ තුවාලයක් වූ විට කළ යුතු ප්‍රථමාධාර ක්‍රමශිල්ප පිළිබඳවයි.

තුවාල අප ශරීරයේ අභ්‍යන්තරිකව හෝ බාහිරව සිදු විය හැකිය. අභ්‍යන්තර තුවාල බාහිර තුවාලවලට වඩා බොහෝ විට භයානක වීමට හේතු විය හැක්කේ ඉන් සිදු වී ඇති හානිය පහසුවෙන් හඳුනා ගැනීමටත්, ප්‍රථමාධාර හෝ ප්‍රතිකාර ඉක්මනින් සිදු කළ නොහැකි නිසාත් ය. කෙසේ වුව ද අභ්‍යන්තර තුවාලයක් ඇති විට එය කටින්, කනින්, මළ මුත්‍රා මාර්ගවලින් හෝ නාසයෙන් ලේ ගැලීම, ඉදිමීම, පැහැය වෙනස්වීම වැනි විවිධ රෝග ලක්ෂණ හා නිමිතිවලින් හඳුනාගත හැකි අතර එවන් අවස්ථාවක කළ යුතු ප්‍රථමාධාර පිළිබඳව අප ඉදිරි පාඩමකදී දැනුවත් කරන්නෙමු. මෙම පාඩමෙන් බාහිරව සිදුවන තුවාලයකදී කළ යුතු ප්‍රථමාධාර පිළිබඳව ඉගෙන ගනිමු.

## තුවාල වර්ග

තුවාලයක් සිදු වූ ආකාරය අනුව වර්ග කිහිපයකට බෙදා දැක්විය හැකිය.

කැපුම් තුවාල (INCISED)



කඩතොළු තුවාල (LACERATION)



සීරීම් තුවාල (GRAZE)



තැලුම් තුවාල (BRUISE)



සිදුරුවූ තුවාල (PUNCTURE)



වෙඩි වැදුම් තුවාල (GUN SHOT)





තුවාලයක් සිදු වූ විට තුවාලකරුට ඇතිවන ප්‍රධාන හානි 03 ක් තිබේ.

- **රුධිර වහනය** (Bleeding)
- **කම්පනය ඇතිවීම** (Shock)
- **ආසාදනය** (Infection)

රුධිර වහනය හා ඒ හේතුවෙන් ඇති වන කම්පනය වහාම ප්‍රථමාධාර ලබා දිය යුතු තත්ත්වයන් දෙකක් වන්නේ ඉන් තුවාලකරුවෙකු අසිහි තත්ත්වයටත්, හෘදය ඇණහිටීමෙන් මිය යෑමත් සිදුවිය හැකි නිසාය. ආසාදනය හේතුවෙන් තුවාලකරුවෙකුට ඉක්මන් ජීවිත තර්ජනයක් ඇති නොවන අතර ඒ සඳහා පියවර ගැනීම ඉතා හදිසි නැත. එම නිසා ප්‍රථමාධාර දීමේදී රුධිර වහනය ඉක්මනින් පාලනය කිරීම සඳහාත්, කම්පනයේ රෝග ලක්ෂණය හා නිමිති හඳුනාගෙන ඊට ප්‍රථමාධාර දීම සඳහාත් අප ප්‍රමුඛතාවය දිය යුතුය. එවිටය තුවාලයක් නිසා ජීවිත හානියක් වීම වැළැක්වීමත්, තත්ත්වය උත්සන්න වීම වැළැක්වීමත්, සුවය පහසු කිරීමත් කළ හැකි වන්නේ.

## රුධිර වහනය (ලේ ගැලීම)




රුධිර වහනය යනු හෘදය, ධමනි, ශිරා, කේශනාලිකා ඇතුළත් රුධිර සංසරණ පද්ධතියෙන් පිටතට රුධිරය කාන්දු වීමයි. එය සිදුවන්නේ තුවාලයක් නිසා මෙන්ම තුවාලයක් නිසා මුහුණ දීමට සිදුවන ප්‍රමුඛතම හානිය ද මෙයයි. එය අභ්‍යන්තරව හා බාහිරව සිදුවිය හැකිය. වැඩිහිටි අයෙකුගේ සිරුරේ සාමාන්‍ය රුධිර පරිමාව ලීටර 5-6 පමණ වේ. වැඩිහිටියෙකුගේ රුධිරය ලීටර 1 ක්, දරුවකුගේ ලීටර 1/2 ක් හා ළදරුවෙකුගේ මිලි ලීටර 100-200 අහිමිවීම බරපතළ තත්ත්වයකි.

රුධිර වහනය බාහිර හා අභ්‍යන්තර වශයෙන් මෙන්ම තුවාලය නිසා හානි වූ රුධිර නාලිකා විශේෂය අනුව ධමනි රුධිර වහනය, ශිරා රුධිර වහනය, කේශ නාලිකා රුධිර වහනය ලෙස ද වර්ග කොට දැක්විය හැකිය. ඒ කුමන රුධිර වහනයක් වුව ඉක්මනින් පාලනය කිරීම අත්‍යවශ්‍යය. එම නිසා අප පළමුවෙන් රුධිර වහනය පාලනය කළ හැකි විද්‍යානුකූල ප්‍රථමාධාර ක්‍රමශිල්ප මොනවාදැයි දැන ගනිමු.

## ලේ ගැලීමක් පාලනය කිරීම

සුළු රුධිර වහනයක් සහිත අසිහි රෝගී අවස්ථාවකදී පළමුව අසිහි තත්ත්වයට ප්‍රථමාධාර කරන්න. නමුත් ස්වසනය නොකරන අවස්ථාවකදී රුධිර වහනය පාලනයට පෙර CPR ලබා දීම අවශ්‍ය විය හැකිය.

■ **Assess & Reassure - තුවාලය හඳුනාගෙන රෝගියා අස්වසන්න.**

හැකියාවක් තිබේනම් කුමන වර්ගයේ තුවාලයක්දැයි හඳුනාගන්න. විශේෂයෙන් තුවාලයක් ඇනී ඇති කිසිවක් තිබේද, ප්‍රධාන ධමනියකට හානි වී තිබේද යන්න පිළිබඳ අවබෝධයක් ලබා ගන්න. රෝගියා කනස්සල්ලට හෝ බියට පත්වීම රුධිර වහනය වැඩි වීමට හේතුවන නිසා රෝගියා අස්වසමින් ඉදිරි පියවරයන් වෙත යොමු වන්න. ඔබ සමීපයේ තිබේනම් දෑත්වලට ග්ලවුස් හෝ පොලිතින් බෑගයක් හෝ භාවිතා කොට හරස් ආසාදනය වැළැක්වීමට පියවර ගන්න. නැතිනම් රුධිරය ඔබේ සිරුරේ නොතැවරෙන පරිදි ක්‍රියාකරන්න.

■ **Direct Pressure - සෘජු පීඩනය**



තුවාලය මත කිසිවක් ඇනී නොමැති නම් පෑඩයක් තබා හෝ නොමැතිව තුවාලය මතම පීඩනයක් යොදන්න. මෙමගින් හානියට ලක්වූ රුධිර නාල තෙරපී මට ලක් වී රුධිරය පිටවීම ක්ෂණිකව සීමා වේ.

■ **Elevation - ඔසවා තැබීම**



හැකි නම් තුවාල වූ ගාත්‍රය (අත් හෝ පාදය) හෘද මට්ටමට වඩා ඉහළට ඔසවන්න. එවිට ඉහළට එසවූ අවයවවලට ලේ සැපයීමේ වේගය අඩු වී රුධිර වහනය පාලනය වේ.

■ **Lay Down - බිම දිගා කිරීම**



තුවාල රෝගියා බිම දිගා කරන්න. අත්වල සුළු තුවාලයක් නම් වාඩි කොට වුව තැබිය හැක. නැතහොත් ක්ලාන්තය, කම්පනය හෝ සිහි නැති වී ඇද වැටීමටත්,

එමගින් තත්ත්වය තවදුරටත් ව්‍යාකූල වීමටත්, රුධිර වහනය වේගවත් වීමට පුළුවන.

### ■ Bandage - වෙළුමක් යෙදීම



තුවාලය මත පෑඩයක් තබා තෙරපෙන පරිදි පිරිසිදු රෙදි කඩකින් හෝ වෙළුම් පටියකින් ඔතන්න. තවදුරටත් රුධිරය ගලයි නම් තවත් වෙළුමක් ඒ මත යොදන්න. වෙළුමේ ගැටය තුවාලය මතම යෙදීමෙන් පීඩනය හොඳින් ලබා දිය හැකිය. නමුත් වෙළුම අනවශ්‍ය ලෙස තදින් ගැටගැසීම අයෝග්‍ය බව සිහිතබා ගන්න.

### ■ Observation - නිරීක්ෂණය කිරීම

**නිය අග පරීක්ෂාව සිදු කරන අයුරු**



සුදු පැහැති වන තුරු නිය අග හොඳින් මිරිකන්න

රුධිර සංසරණය වේනම්, ඉක්මනින් රතු පැහැයට හැරේ.

වෙළුම් හෝ රෙදි පටි යෙදූ තැනින් එහා කොටස්වලට ලේ ගමනාගමනය වන්නේදැයි පරීක්ෂා කරන්න. එය වෙළුම යෙදු තැනින් එහා අවයව කොටස්වල නාඩි පරීක්ෂා කොට නාඩි වේගය හඳුනා ගැනීම, එම කොටස්වල වේදනාව, ඉදිමීම, පැහැය වෙනස්වීම, නිය අග පරීක්ෂාව, සීතල වීම, හිරි වැටීම යන විවිධ මාර්ගයන්ගෙන් හඳුනාගත හැකිය. එමගින් රුධිර සංසරණයේ ගැටලුවක් හඳුනාගත හොත් ඔබ යෙදූ වෙළුම ලිහිල් කළ යුතුය. නැතහොත් එම ප්‍රදේශවලට රුධිර සංසරණය නොවී එම ප්‍රදේශවල පටක සෛල වෙත ඔක්ෂිජන් පරිවහනය නොවීමෙන් ලැක්ටික් නමැති අතිශයින් විෂ සහිත අම්ලයක් නිෂ්පාදනය වී ප්‍රබල ජීවිත තර්ජනයක් ඇති විය හැකිය.

### ■ Treat for other injuries - වෙනත් තුවාල හා අනතුරු සඳහා ප්‍රථමාධාර

තවදුරටත් තුවාල, අස්ථි භග්න, උළුක්කු, ක්ලාන්තය හෝ වෙනත් අනතුරු ඇත්නම් පරීක්ෂා කොට බලා ඒවාට ප්‍රථමාධාර කරන්න. එමෙන්ම රෝගී යාගේ ස්වසනය, සාමාන්‍ය රුධිර සංසරණය නිසි පරිදි ක්‍රියාත්මකදැයි යන්න පිළබිඳව නිරන්තරයෙන් විමසිල්ලෙන් සිටින්න.

### ■ Shock - කම්පනය

තුවාලයකින් රුධිර වහනය වීම හෝ වෙනත් රුධිර සංසරණයට වන බාධා නිසා නාඩි අක්‍රමවත් වීම, සම සුදුමැලි වීම, ඇලෙන සුළු තෙත් දහඩිය ගතිය, පිපාසය, සිරුර සිසිල් වීම වැනි රෝග ලක්ෂණ හා නිමිති පෙන්විය හැක. එය කම්පන තත්වයයි. කම්පනය ඇත්නම් හාන්සි කරවන්න. පාද ඔසවා තබන්න. බ්ලැන්කට්ටුවකින් ආවරණය කරන්න. තද ඇඳුම් ලිහිල් කරන්න. මනා වාතාශ්‍රයක් ලබා දෙන්න. ජෛව සාධක පිරික්සන්න.



**■ වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු කරන්න. තුවාල කළමනාකරණයේදී ඔබේ ආරක්ෂාව තහවුරු කරන්න.**

මෙම ක්‍රම අනුගමනය කිරීම මගින් රුධිරයේ ඇති රුධිර පට්ටිකා ඒකරාශී වී රුධිර කැටියක් තුවාල වූ ස්ථානයේ ඉක්මනින් ඇති කොට රුධිර වහනය පාලනය කරගත හැකි වනු ඇත.

**අවවාදයයි !**

පහත සඳහන් දෑ සිදු නොකරන්න.

- රුධිරය ගලන විට ජලයෙන් සෝදා හැරීම
- අයිස් තැබීම
- තුවාලයට ඉහළින් තදකර (තිරිංග) වෙළුම් දැමීම

ඉදිරි පාඩම්වලදී විවිධ සංකීර්ණ තුවාලවලින් රුධිර වහනය වීම සහ අභ්‍යන්තර රුධිර වහනයකදී කළ හැකි ප්‍රථමාධාර පිළිබඳව අවධානය යොමු කරමු.

ඉහත ප්‍රථමාධාර ක්‍රමශිල්ප එදිනෙදා ප්‍රායෝගිකව භාවිතා කිරීම සඳහා විධිමත් ප්‍රථමාධාර පුහුණුවකට සහභාගී වීම අත්‍යවශ්‍ය වන අතර මෙම තොරතුරු කියවීම පමණක් ප්‍රථමාධාර ලබාදීමට ප්‍රමාණවත් හැකියාවක්, දැනුමක් හා විශ්වාසයක් ලබා නොදෙයි. ජීවිතයට අතිශය වැදගත් මෙවැනි ප්‍රථමාධාර ක්‍රම ශිල්ප පිළිබඳ විධිමත් පුහුණුවක් ලබා ගැනීමේ අවස්ථාව ශ්‍රී ලංකා රතු කුරුස සමාජය මගින් ඔබට ලබා ගත හැක. ඒ පිළිබඳ තොරතුරු සඳහා www.redcross.lk වෙත පිවිසෙන්න. කතා කරන්න 0115347000.



# 5 වන දකුණු ආසියානු චීන මිත්‍ර සමුළුව

චීනයේ චෙන්ග්ඩු නගරයේ පැවති දකුණු ආසියානු චීන මිත්‍ර සමුළුවට සහභාගී වූ දූත පිරිස්








# දහම් පාසල් සඳහා ද්‍රව්‍යමය ආධාර

ශ්‍රී ලංකා චීන බෞද්ධ මිත්‍රත්ව සංගමය විසින් දහම් පාසල් සඳහා ද්‍රව්‍යමය ආධාර ලබාදීමේ වැඩපිළිවෙලේ 2වන පියවර පසුගියදා බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විනි. මේ අවස්ථාව සඳහා සංගමයේ සභාපති නීතීඥ සුමති ධර්මවර්ධන මහතා සහ ලේකම් සුදත් මඩුගල්ලේ මහතා සහභාගීවිය.





# ශ්‍රී ලංකා චීන වසර 60 ක මිත්‍රත්වය සැමරීම සඳහා සංවිධානය කරන රචනා තරගය

## මාතෘකාව : එදා මෙදා තුර ශ්‍රී ලංකා චීන මිතුදම

**ජ්‍යෙෂ්ඨ අංශය (11,12,13 ශ්‍රේණිවල පාසල් සිසුන් සඳහා )**

ප්‍රථම ත්‍යාගය - රු 15,000/-
දෙවන ත්‍යාගය - රු. 10,000/-
තෙවන ත්‍යාගය - රු. 5,000/-
හතරවන ස්ථානයේ සිට දසවන ස්ථානය දක්වා - රු. 1000/-

**රචනාව වචන 750 වඩා වැඩි විය යුතුය**

**කණිෂ්ඨ අංශය (6,7,8, 9 සහ 10 ශ්‍රේණිවල පාසල් සිසුන් සඳහා)**

ප්‍රථම ත්‍යාගය රු 10,000/-
දෙවන ත්‍යාගය රු. 7,000/-
තෙවන ත්‍යාගය රු. 3,500/-
හතරවන ස්ථානයේ සිට දසවන ස්ථානය දක්වා රු. 1000/-

**රචනාව වචන 500 වඩා වැඩි විය යුතුය**

ඔබගේ රචනාව පහත සදහන් කූපනය පුරවා පන්ති භාර ගුරුතුමා මගින් විදුහල්පති තුමා/ දහම් පාසල් ප්‍රධානාචාර්ය තුමාගේ අත්සනින් සහතික කර කවරයේ වම් කෙලවරේ තමාට අයත් කාණ්ඩය සදහන් කොට 2017 ඔක්තොම්බර් 31 දිනට පෙර පහත සදහන් ලිපිනයට එවිය යුතුය.

ශ්‍රී ලංකා රතු කුරුස සමාජය,
නො 59 A , ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07.

සම්පූර්ණ නම : ..........................................
ශ්‍රේණිය : ..........................................
අයත් කාණ්ඩය : ..........................................
පාසල/දහම් පාසල : ..........................................
නිවසේ ලිපිනය : ..........................................
දුරකතන අංකය : ..........................................
සහතික කිරීම

.................................... ....................................
පන්තිභාර ගුරුතුමියගේ අත්සන විදුහල්පති තුමා/ දහම් පාසල් ප්‍රධානාචාර්ය තුමාගේ අත්සන

## සුභාසර පාඨක සාමාජිකයෝ



සාමාජික අං : 95
**සයුරි තිලෝකා**
ශ්‍රී රාහුල බාලිකා මහාවිදුහල
මාලබේ



සාමාජික අං : 96
**සකිත් තනුමිත**
ආදර්ශ පිරිමි විදුහල
මාලබේ



සාමාජික අං : 97
**තිසුම් මාවින්ද**
මලියදේව විදුහල
කුරුණෑගල



සාමාජික අං : 98
**සෙහන්සා රමින්ති**
මලියදේව බාලිකා විදුහල
කුරුණෑගල



සාමාජික අං : 99
**මිරාෂා ලක්මි**
ශ්‍රී රාහුල බාලිකා මහාවිදුහල
මාලබේ



සාමාජික අං : 100
**මලීෂා නෙත්මි**
ශ්‍රී රාහුල බාලිකා මහාවිදුහල
මාලබේ

## සුභාසර පාඨක සාමාජිකත්වය

චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය සහ ශ්‍රී ලංකා රතු කුරුස සමාජය ඒකාබද්ධව ත්‍රෛයි මාසිකව නිකුත් කරනු ලබන සුභාසර සඟරාවේ පාඨක සාමාජිකත්වය ලබා ගැනීම සඳහා පහත විස්තර පුරවා මෑතකදී ගත් 2.5 x 3.5 cm ප්‍රමානයේ ඡායාරූපයක් සමග අපගේ ලිපිනය වෙත යොමු කරන්න.

නම : ..........................................
ලිපිනය : ..........................................
වයස : .................... පාසල : ....................
දුරකථන : .................... විද්‍යුත් ලිපිනය : ....................
ප්‍රශ්නය : මෙවර සුභාසර කලාපයේ ඔබ වඩාත් කැමති ලිපිය කුමක්ද?
පිළිතුර : ..........................................

අපගේ ලිපිනය : 4/91A, 5 වන පටුමග, තලකොටුව වත්ත, පොල්හේන්ගොඩ, කොළඹ 05. P. O Box : 1774




| | Frequency | Time (Sri Lanka) | |
|---|---|---|---|
| FM | CRI - Sri Lanka FM97.9 | 05.00-10.00 (Eng) | 10.00-00.00 (Sin) |
| Short wave | 7260/9490/7265/11900 | 19:30-20:30 | 05:00-06:00 |
| Online | http://sinhalese.cri.cn/ | | |

# චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය

ශ්‍රී ලංකා ජන ජීවිතය මැනවින් හඳුනාගත් සුහද මිතුරෙකු ලෙස චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය ඉදිරි ගමනක් ආරම්භ කර තිබේ. ශ්‍රී ලංකාව පුරා විසුරුවා හැරෙන කෙටි තරංග සහ බස්නාහිර පළාත ආවරණය කරන FM තරංග විකාශනයක් සිංහල සේවය සතුවෙයි. සියළු වැඩසටහන්වලට පොඩ්කාස්ට්න් සේවාව ඔස්සේද සවන් දිය හැකිය.

සිංහල සේවය ආරම්භ වූයේ වසර 1975 ජනවාරි පළමු දාය. එවක පැවැතියේ කෙටි තරංග විකාශනයක් පමණි. වසර 2010 අප්‍රේල් 23 වනදා එහි FM තරංග විකාශනය ආරම්භ කෙරිණ.

මේ වන විට චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි හා රූපවාහිනී මාධ්‍ය හා පුවත්පත් සමඟ මනා සහයෝගික සම්බන්ධතාවකින් යුක්තව ඉදිරියට ගමන් කරමින් සිටී.

චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවයේ වැඩසටහන් ශ්‍රී ලංකාවේ සමස්ත පවුල් ඒකකය ඉලක්ක කොට විසුරුවා හරිනු ලැබේ. වැඩසටහන් අන්තර්ගතය චීනය සහ ශ්‍රී ලංකාව අතර ඇති සාම්ප්‍රදායික මිත්‍රත්වය සහ රාජ්‍යතාන්ත්‍රික බැදීම පදනම් කොට සකස් කර තිබේ. සතියේ දින පහ තුළ, ආර්ථිකය, සංස්කෘතිය, ජන ජීවිතය සහ මිත්‍රත්වය, සංචාරය, සූප කලාව, චීනයේ භාෂා අධ්‍යයනය වැනි විෂය ක්ෂේත්‍ර ඔස්සේ වැඩසටහන් විකාශනය කෙරේ. විචිත්‍රාංග සමාජ හා කාලීන තොරතුරු සඳහා ද විශේෂත්වයක් හිමිව තිබේ. චීනයේ ශ්‍රී ලංකාවේ සහ ලෝකයේ නැවුම් තොරතුරු රැගත් ප්‍රවෘත්ති විකාශනයක්ද දිනපතා සිදුකෙරේ.

中 国 国 际 广 播 电 台
CHINA RADIO INTERNATIONAL


**SINHALA SERVICE**
**CHINA RADIO INTERNATIONAL**

No.16A, Shijingshan Road,
Beijing, P.R. China
Post code:100040
Tel: 00 86 10 6889 2373/0439
Fax: 00 86 10 68892361
Email: sinhalacri@gmail.com
Web: http://sinhalese.cri.cn/
Facebook: Cheena Sinhala handa
Twitter: Voice of China-Lanka